# ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය

# නව අධ්‍යයන පාඨමාලාව

**ව්‍යවහාරික බැංකු සහ මූල්‍ය අන්තර් පාඨමාලාව**

**(IABF)**

**සහ**

**ව්‍යවහාරික බැංකු සහ මූල්‍ය ඩිප්ලෝමා පාඨමාලාව**

**(DABF)**

*බැංකු සහ මූල්‍ය නව්‍යකරණය වෙනුවෙන්*

*දැනුම ගවේෂණය කර බෙදාදීමේ මෙහෙවර උදෙසා*

1964 - 2017

IBSL

INSTITUTE OF BANKERS OF SRI LANKA

CREATING STARS

නව අධ්‍යයන පාඨමාලාව : 2017

ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය

මුද්‍රණය : තිලක ප්‍රින්ටර්ස්

# පාඨමාලාව හැඳින්වීම

බැංකුවලත්, වෙනත් මූල්‍යායතන සහ වෙළෙඳ පොළවලත්, නියාමන ආයතන වලත් සේවයේ නියුතු වූවන්ටද එකී අංශවල රැකියා අපේක්ෂා කරන්නන්ටද, ආයතනික අංශයේ වෘත්තිකයින්ටද බැංකු සහ මූල්‍ය කටයුතු සම්බන්ධව ප්‍රායෝගික දැනුම ලබාදීමේ අරමුණින් මෙම නව අධ්‍යයන වැඩසටහන නිර්මාණය කරන ලදි. මෑත කාලයේ දේශීය මෙන්ම ගෝලීය වශයෙන්ද බැංකු සහ මූල්‍ය අංශයන් හි සිදු වූ වෙනස්කම් සහ දැනටමත් සිදු වෙමින් පවතින සංවර්ධනයන් ගැන සැලකීමේ දී දැනට පවතින අධ්‍යයන වැඩසටහනට ඇතුළත් බැංකු සහ මූල්‍ය සහතික පත්‍ර (CBF) පාඨමාලාව  සහ බැංකු සහ මූල්‍ය ඩිප්ලෝමා (DBF) පාඨමාලාව යන පාඨමාලාවන් දෙකෙහි ඇති අන්තර්ගත විෂය පථය සීමිත බැවින්, එම පාඨමාලා වෙනුවට මෙම නව පාඨමාලාව හඳුන්වා දී ඇත. එක්සත් රාජධානියේ වරලත් බැංකුකරුවන්ගේ ආයතනය (IFS) විසින් ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය (IBSL) පිළිගැනීමට ලක් කිරීමෙන් අනතුරුව 2000 වසරේදී සහතික පත්‍ර (CBF) සහ ඩිප්ලෝමා (DBF) පාඨමාලා, හඳුන්වා දෙනු ලැබිණි. 2007 වසරේදී විෂයයන් සම්බන්ධ ඇතැම් සංශෝධනයන් සිදු කළ ද, දේශීය සහ ගෝලීය වශයෙන් මූල්‍ය අංශයේ සිදු වෙමින් ඇති නව සංවර්ධනයන් සහ විශේෂයෙන්ම, 2007 මැද කාලයෙන් පසු ගෝලීය ආර්ථික සහ මූල්‍ය අර්බුද හේතුකොටගෙන සිදුවෙමින් පවතින ගෝලීය ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය සැලකිල්ලට ගැනීමේ දී, එකී පාඨමාලාවන් මගින් ආවරණය වන දැනුම ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය කළ හැකි විය. තවද, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය (IBSL) විසින් දේශීය සහ විදේශීය යන දෙඅංශයේම සේවා නියුක්තිකයින්ට සහ රැකියා අපේක්ෂිතයින්ට උපාධි මට්ටමේ අධ්‍යයන සහ පුහුණු අවස්ථා සලසා දීමේ අරමුණෙන්, බැංකු සහ මූල්‍ය කටයුතු සම්බන්ධ උපාධි පාඨමාලාවක් හඳුන්වා දීමට මේවන විට කටයුතු කෙරෙමින් පවතී. ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතන පනතින් ලැබී ඇති බලතල අනුව ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයෙහි (IBSL) පාලක මණ්ඩලය විසින්, සහතිකපත්‍ර පාඨමාලාව (CBF) සහ ඩිප්ලෝමා පාඨමාලාව (DBF) වෙනුවට, මෙම නව අධ්‍යයන වැඩසටහන, එනම්,

1. ව්‍යවහාරික බැංකු සහ මූල්‍ය අන්තර් පාඨමාලාව (IABF)  සහ
2. ව්‍යවහාරික බැංකු සහ මූල්‍ය ඩිප්ලෝමා පාඨමාලාව  (DABF) යන

නව පාඨමාලා හඳුන්වා දීමට තීරණය කරන ලද්දේ එවැනි දැක්මක් සහිතවය. බැංකු, මූල්‍ය සහ ආයතනික අංශයේ සේවයේ නිරත සේවක පිරිස, ආයතනික අංශයේ වෘත්තිකයින් සහ මෙම අංශයන් ට ප්‍රවිෂ්ඨ වීමට අවශ්‍ය සුදුසුකම් සපුරා ගැනීමට අපේක්ෂා කරන ශිෂ්‍ය ශිෂ්‍යාවන් මෙහි ලා අපගේ ඉලක්ක කණ්ඩායම් වේ.

# පාඨමාලා විෂයයන්

මෙම පාඨමාලාව, කොටස් දෙකකින් සහ විශේෂිත විෂයයන් 17 කින් සමන්විත වේ. එම කොටස් දෙක වනුයේ "ව්‍යවහාරික බැංකු සහ මූල්‍ය අන්තර් පාඨමාලාව (IABF) ", පළමු මට්ටම සහ "ව්‍යවහාරික බැංකු සහ මූල්‍ය ඩිප්ලෝමා පාඨමාලාව (DABF) ", ඩිප්ලෝමා මට්ටම වේ. මෙම පාඨමාලාවට අනිවාර්ය විෂයයන් 8 ක් සහ වෛකල්පික විෂයයන් 9 ක් ඇතුළත් වන අතර වෛකල්පික විෂයයන්ගෙන් 5 ක් අනිවාර්යයෙන්ම තෝරා ගත යුතුය. මේ අනුව අයදුම්කරුවෙකු විසින් පාඨමාලාව සම්පූර්ණ කිරීම පිණිස විෂයයන් 13 ක් සමත් විය යුතු ය. මෙම පාඨමාලාවේ සියලුම විෂයයන් සෘජුවම බැංකු සහ මූල්‍ය ක්ෂේත්‍රය නියෝජනය කෙරෙන අතර, ඒවා වෙළෙඳපොළේ බැංකු සහ මූල්‍ය වෘත්තීන් සඳහා ප්‍රමිතිගත විෂයයන් ලෙස හඳුන්වා දෙනු ලැබේ. වෙනත් වෘත්තීයමය පාඨමාලා සහ වැඩසටහන් සඳහා බැංකු සහ මූල්‍ය අංශයට අදාළ මූලික විෂයයන් මෙම වැඩසටහනින් තෝරා ගත හැකිය. වෘත්තීයමය කුසලතා සහ ප්‍රවීණත්වය යාවත්කාලීන කරනු වස් බැංකු සහ මූල්‍ය කටයුතුවල නව වර්ධනයන් ද සැලකිල්ලට ගනිමින් සෑම වසර දෙකකට වරක් මෙම විෂය මාලාවන් සංශෝධනය සහ යාවත්කාලීන කරනු ඇත. මෙම පාඨමාලා දෙකට සම්බන්ධ විෂයයන් පහත දැක්වේ.

## (1) ව්‍යවහාරික බැංකු සහ මූල්‍ය අන්තර් පාඨමාලාව
## Intermediate in Applied Banking and Finance
**(අනිවාර්ය විෂයයන් 4 ක් සහ වෛකල්පික විෂයයන් 4 න් 2 ක් ඇතුළුව විෂයයන් 6 කි)**

### අනිවාර්ය විෂයයන්

| | |
|---|---|
| 1. මූල්‍ය පද්ධතිය සමීක්ෂණය | (Survey of Financial System) |
| 2. වාණිජ බැංකු කටයුතු | (Commercial Banking) |
| 3. ව්‍යාපාර ගිණුම්කරණය | (Business Accounting) |
| 4. බැංකු සහ මූල්‍ය නීතිය හැඳින්වීම | (Introducation to Banking and Financial Law) |

### වෛකල්පික විෂයයන්

| | |
|---|---|
| 1. ආර්ථික විද්‍යා මූලධර්ම | (Principles of Economics) |
| 2. බැංකු නොවන මූල්‍ය ව්‍යාපාර කටයුතු | (Non - Banking Financial Business) |
| 3. මූල්‍ය ගනුදෙනුකරුවන් කළමනාකරණය | (Financial Clients Management) |
| 4. ව්‍යාපාර ගණිතය සහ සංඛ්‍යානය | (Business Mathematics and Statistics) |

## (11) ව්‍යවහාරික බැංකු සහ මූල්‍ය ඩිප්ලෝමා පාඨමාලාව

## Diploma in Applied Banking and Finance

( අනිවාර්ය විෂයයන් 4 ක් සහ වෛකල්පික විෂයයන් 5 න් 3 ක් ඇතුළුව විෂයයන් 7 කි )

**අනිවාර්ය විෂයයන්**

1. මුදල් සහ මූල්‍ය ප්‍රතිපත්ති ආර්ථික විද්‍යාව (Economics of Money and Monetary Policy)
2. මූල්‍ය කළමනාකරණය (Financial Management)
3. ජාත්‍යන්තර වෙළෙඳාම සහ මූල්‍යය (International Trade and Finance)
4. ණය කළමනාකරණය (Credit Management)

**වෛකල්පික විෂයයන්**

1. මූල්‍ය ආයතන කළමනාකරණය (Financial Institutions Management)
2. මූල්‍ය වෙළෙඳපොළ කටයුතු (Financial Markets Operations)
3. ආයෝජන බැංකු කටයුතු (Investment Banking)
4. සංවර්ධන මූල්‍යය (Development Finance)
5. මහ බැංකු කටයුතු (Central Banking)

## කුසලතා සහ හැකියාවන් වර්ධනය

බැංකු සහ මූල්‍ය අංශයේ වෘත්තිකයින්ගේ කුසලතා සහ හැකියාවන් ප්‍රධාන ක්ෂේත්‍ර තුනක් ඔස්සේ වර්ධනය කිරීම නව පාඨමාලාවේ අරමුණ වී ඇත. (විස්තර සඳහා 6වන පිටුවෙහි ඇති සටහන බලන්න). ව්‍යාපාර කටයුතු, ආයතන කළමනාකරණය, බැංකු සහ මූල්‍ය ප්‍රතිපත්ති/නියාමන පරිසරය මෙහිදී ආවරණය කරනු ලබයි. සෑම විෂය ක්ෂේත්‍රයක් සඳහා ම නිශ්චිත විෂයයන් හඳුනාගෙන ඇති අතර, එම සියලුම විෂයයන් ඉහත ක්ෂේත්‍ර තුන තුළ විවිධ මට්ටම්වලින් ආවරණය කරනු ලබයි. කුසලතා සහ හැකියාවන් වර්ධනය කිරීමෙන් ඒවා වෘත්තීය කටයුතු සඳහා ඵලදායී ලෙස උපයෝගී කර ගැනීමට ප්‍රමිතිගත ප්‍රායෝගික හා න්‍යායාත්මක දැනුම ලබා දීම මෙම විෂයයන් තුළින් අපේක්ෂා කෙරේ. එම නිසා, මෙම පාඨමාලාවෙන් සුදුසුකම් ලබන බැංකු සහ මූල්‍ය වෘත්තිකයින්ගේ වෘත්තීය තත්ත්වය බෙහෙවින් ඵලදායී හා වේගවත් ලෙස වර්ධනය වනු ඇත. තව ද ඔවුන් ට නුදුරු අනාගතයේ දී ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය විසින් හඳුන්වා දීමට නියමිත බැංකු සහ මූල්‍ය උපාධි පාඨමාලාවට ඇතුළත්වීමේ අවස්ථාව ද සැලසෙනු ඇත.

## පාඨමාලාව ක්‍රියාත්මක කිරීමේ නීති රීති

(i) 2014 ජනවාරි මස පළමුවන දින සිට ව්‍යවහාරික බැංකු සහ මූල්‍ය අන්තර් පාඨමාලාව (IABF) සඳහා නව සිසුන් ලියාපදිංචි කරගනු ලබන අතර, 2014 ජනවාරි 1 වෙනි දින සිට බැංකු සහ මූල්‍ය සහතික පත්‍ර (CBF) පාඨමාලාව සඳහා නව ශිෂ්‍යයින් ලියාපදිංචිය අත්හිටුවා ඇත.

(ii) 2013 දෙසැම්බර් මස 31 වෙනි දින හෝ ඊට පෙර ලියාපදිංචි වූ ශිෂ්‍යයන්ට සහ බැංකු සහ මූල්‍ය සහතික පත්‍ර පාඨමාලාව දැනටමත් සම්පූර්ණ කරනු ලැබූ ශිෂ්‍යයින්ට තම මනාපය පරිදි ව්‍යවහාරික බැංකු සහ මූල්‍ය ඩිප්ලෝමා පාඨමාලාව (DABF) හෝ බැංකු සහ මූල්‍ය ඩිප්ලෝමාව (DBF) සඳහා පෙනී සිටීමට හැකිවේ.

(iii) 2013 දෙසැම්බර් 31 දිනට පෙර බැංකු සහ මූල්‍ය සහතික පත්‍ර (CBF) විභාගයෙන් නිදහස් වූ ශිෂ්‍ය සාමාජිකයින් සඳහා ඔවුන්ගේ මනාපය අනුව ව්‍යවහාරික බැංකු සහ මූල්‍ය ඩිප්ලෝමා (DABF) හෝ බැංකු සහ මූල්‍ය ඩිප්ලෝමා (DBF) විභාගය සඳහා තම නිදහස් වීමේ පදනම මත ඉදිරිපත් විය හැකිය.

(iv) ව්‍යවහාරික බැංකු සහ මූල්‍ය අන්තර් පාඨමාලා (IABF) විභාගයෙන් තෝරා ගත් විෂයයන් සඳහා නිදහස් කිරීම සඳහා සලකා බලනුයේ උපාධි පාඨමාලාවල සහ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය (IBSL) විසින් පිළිගනු ලබන වෘත්තීය සුදුසුකම් වල ප්‍රධාන විෂයය පමණක් වන අතර, එම විෂයය අන්තර් පාඨමාලා (IABF) විෂය නිර්දේශයේ ඇතුළත් විෂයයක් ද විය යුතුය. නව ඩිප්ලෝමා (DABF) විභාගයේ කිසිදු විෂයයක් සඳහා නිදහස් කිරීම් සලකා බලනු නොලැබේ.

(v) පැරණි පාඨමාලා (CBF සහ DBF) විභාගයන් 2016 සැප්තැම්බර් වන තෙක් පවත්වනු ලබන අතර සාමාජිකයින්ගේ ඉල්ලීම මත තවත් වසරක් හෝ දෙකක් දක්වා දීර්ඝ කිරීමට ද සලකා බලනු ලැබේ.

(vi) දැනටමත් බැංකු සහ මූල්‍ය සහතික පත්‍ර පාඨමාලාව (CBF) සඳහා ලියාපදිංචි වී ඇති ශිෂ්‍ය සාමාජිකයින්ට සහතික පත්‍ර පාඨමාලාවේ (CBF) සිට සිය අභිමතය පරිදි ඕනෑම වේලාවක අන්තර් පාඨමාලාව (IABF) වෙත මාරු විය හැකිය. එසේ වුවත්, සහතිකපත් පාඨමාලා (CBF) විභාගයේ විෂය සාමාර්ථයන් හෝ පැරණි බැංකු හා මූල්‍ය ඩිප්ලෝමා (DBF) විභාගයේ විෂය

සාමාර්ථයන් මත අන්තර් පාඨමාලා (IABF) විභාගයේ හෝ බැංකු හා මූල්‍ය ඩිප්ලෝමා (DABF) විභාගයේ විෂයයන්ගෙන් නිදහස් වීමට අවසර දෙනු නොලැබේ.

(vii) 2014 සැප්තැම්බර් මාසයේ සිට අන්තර් පාඨමාලාවේ (IABF) සහ නව ඩිප්ලෝමා පාඨමාලාවේ (DABF) විභාග ආරම්භ වී ඇති අතර, වසරකට දෙවතාවක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා මාධ්‍යයන්ගෙන්, මාර්තු සහ සැප්තැම්බර් මාසයන්හි දී, අදාළ විභාග පැවැත්වෙනු ඇත. සෑම විෂයක් සඳහාම වන විභාග, පැය 3 ක ලිඛිත ප්‍රශ්න පත්‍රයක් සහිතව කොළඹ දී සහ අයදුම්කරුවන්ගේ දිස්ත්‍රික්ක ව්‍යාප්තිය අනුව තෝරාගත් පිට පළාත් මධ්‍යස්ථානවල දී පැවැත්වෙනු ඇත.

(viii) ඒ අනුව, පිරිනමනු ලබන කාර්ය සාධන ශ්‍රේණි පහත දැක්වෙන පරිදි වේ.

| | | |
|---|---|---|
| A | - විශිෂ්ට සාමාර්ථය | - 85 සහ ඊට වැඩි |
| B | - කුසලතා සාමාර්ථය | - 75 -84 |
| C | - සම්මාන සාමාර්ථය | - 65 -74 |
| S | - සාමාන්‍ය සාමාර්ථය | - 45 -64 |
| F | - අසමත් | - 45 ට අඩු |

සෑම අවස්ථාවකම උත්තර පත්‍රවල අවසන් මුළු ලකුණු ප්‍රමාණය ගණනය කිරීමේ දී දශමස්ථාන සහිතව ඇති විට ඒවා ආසන්න අගයට වටයනු ලැබේ.

(ix) විභාග ක්‍රියාවලියේ අභ්‍යන්තර පාලනය සහ ගුණාත්මකභාවයේ අනුකූලතාව පිළිබඳ ව ස්වාධීන බාහිර විගණනයකින් ද, සියුම් අධීක්ෂණයකින් ද පසු පාලක මණ්ඩලය විසින් ප්‍රතිඵල නිකුත් කෙරෙනු ඇත.

(x) සෑම විභාගයකට ම පසු නිල අධ්‍යයන ප්‍රතිඵල ලේඛන ශ්‍රේණි සහිතව සාමාජිකයින්ට නිකුත් කෙරෙනු ඇත. ව්‍යවහාරික බැංකු සහ මූල්‍ය අන්තර් පාඨමාලාව (IABF) හෝ ව්‍යවහාරික බැංකු සහ මූල්‍ය ඩිප්ලෝමා පාඨමාලාව (DABF) සම්පූර්ණ කිරීමෙන් අනතුරුව අවසන් අධ්‍යයන ප්‍රතිඵල ලේඛනය සහ නිල සහතික පත්‍ර නිකුත් කරනු ලැබේ.

(xi) ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ (IBSL) හි වාර්ෂික උපාධි ප්‍රදානෝත්සවයේ දී ව්‍යවහාරික බැංකු සහ මූල්‍ය ඩිප්ලෝමා (DABF) පාඨමාලාවේ සහතිකපත් ප්‍රදානය කෙරේ.

(xii) විභාග ප්‍රතිඵල නිකුත් කිරීමෙන් අනතුරුව උත්තර පත්‍ර නැවත පරීක්ෂා කිරීම සඳහා කරනු ලබන ඉල්ලීම් සඳහා සේවා ගාස්තුවකට යටත්ව අවසර දෙනු ලැබේ.

## පාඨමාලාව සඳහා ලියාපදිංචි වීම

අන්තර් පාඨමාලා (IABF) විභාගය සඳහා ශිෂ්‍ය සාමාජිකයෙකු ලෙස ලියාපදිංචි වීමට පහත සඳහන් සුදුසුකම් සපුරාලිය යුතුය.

(i) ශ්‍රී ලංකාව තුළ හෝ විදේශයක, කවර හෝ ව්‍යවස්ථාවක් යටතේ බලපත්‍රයක් හෝ අනුමැතියක් ලබා ඇති බලපත්‍රලාභී බැංකුවක හෝ මූල්‍ය ආයතනයක සේවකයෙකු වීම හෝ

(ii) සමාගම් පනත යටතේ සංස්ථාපිත සමාගමක සේවකයෙකු වීම හෝ ශ්‍රී ලංකාවේ හෝ විදේශයක සම්මතකර ඇති නීතියකට අනුව සංස්ථාපනය කරන ලද සමාගමක සේවකයෙකු වීම හෝ

(iii) ශ්‍රී ලංකාවේ හෝ විදේශයක පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිලාභියෙකු හෝ උපාධි අපේක්ෂකයෙකු වීම.

(iv) ශ්‍රී ලංකාවේ හෝ විදේශයක, වෘත්තීය ආයතනයක් මගින් අපේක්ෂිත බැංකු, මූල්‍ය, විගණනය, කළමනාකරණය සහ අලෙවිකරණය යන විෂයයන් සම්බන්ධව අධ්‍යයන මට්ටම් සම්පූර්ණ කර තිබීම හෝ

(v) ශ්‍රී ලංකාවේ දී හෝ විදේශයක දී අපොස (උ.පෙළ) හෝ ඒ හා සමාන විභාගයකින් විෂයයන් 3 ක් සම්මාන සාමාර්ථ 2 ක් සහිතව සමත් වී තිබීම සහ ශ්‍රී ලංකාවේ දී හෝ විදේශයක දී අපොස (සා.පෙළ) හෝ ඒ හා සමාන විභාගයකින් ගණිතය විෂයයට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම හෝ

(vi) ශ්‍රී ලංකාවේ දී හෝ විදේශයක දී අපොස (උ.පෙළ) හෝ ඒ හා සමාන විභාගයකින් විෂයයන් දෙකක් සමත් වී තිබීම සහ ශ්‍රී ලංකාවේ දී හෝ විදේශයක දී අපොස (සා.පෙළ) හෝ ඒ හා සමාන විභාගයකින් දෙවරක දී වත් ගණිතය ද ඇතුළුව විෂයයන් 5 කට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 6 කින් සමත් වී තිබීම හෝ

(vii) ශ්‍රි ලංකාවේ දී හෝ විදේශයක දී අපොස (සා.පෙළ) හෝ ඒ හා සමාන විභාගයකින් එක් වරකදී ගණිතය ද ඇතුළුව විෂයයන් 5 කට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 6 කින් සමත් වී තිබීම.

# ව්‍යවහාරික බැංකු සහ මූල්‍ය අන්තර් පාඨමාලාව

මෙම පාඨමාලාවෙන්, ශිෂ්‍ය සාමාජිකයනට ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයෙහි (IBSL) හි විශේෂිත උසස් පාඨමාලාවන් හා ඉදිරියට යනු පිණිස එනම්; ව්‍යවහාරික බැංකු සහ මූල්‍ය ඩිප්ලෝමා පාඨමාලාව, සහ යෝජිත අභ්‍යන්තර උපාධි පාඨමාලාව "ව්‍යවහාරික බැංකු සහ මූල්‍ය උපාධි පාඨමාලාව" හැදෑරීම පිණිස අවශ්‍ය බැංකු සහ මූල්‍ය මූලධර්ම සහ පරිචයන් සම්බන්ධ පදනම සකස්කර දීම අරමුණු කරනු ලබයි. එම නිසා, මෙම පාඨමාලාවෙන් ආවරණය වන විෂයයන් සැලසුම් කර ඇත්තේ බැංකු සහ මූල්‍ය වෘත්තිකයින් සහ ශිෂ්‍යයන් සඳහා මූලධර්ම සහ පරිචයන් පිළිබඳව පුළුල් ක්ෂේත්‍රයක් ආවරණය කෙරෙන පසුබිම් දැනුම ලබා දීම සඳහාය. මෙහිදී මූල්‍ය පද්ධතිය සමීක්ෂණය, වාණිජ බැංකු කටයුතු, ව්‍යාපාරික ගිණුම්කරණය, බැංකු සහ මූල්‍ය නීතිය හැඳින්වීම, ආර්ථික විද්‍යා මූලධර්ම, බැංකු නොවන මූල්‍ය ව්‍යාපාර, මූල්‍ය ගනුදෙනුකරුවන් කළමනාකරණය, ව්‍යාපාරික ගණිතය සහ සංඛ්‍යානය යන විෂයයන් ආවරණය කරනු ලැබේ. මෙම ක්ෂේත්‍රයේ දැනටමත් නියැලී සිටින වෘත්තිකයින්ට ඔවුන්ගේ දැනුම වර්ධනයට සහ යළි සංවිධානය කර ගැනීමටත්, ක්‍රමානුකූල සහ පැහැදිලි මග පෙන්වීම් යටතේ සිය ඉගෙනුම ආරම්භ කිරීමටත් හැකියාව ලැබේ. මෙම පාඨමාලාවේ දී අනිවාර්ය විෂයයන් 4 ක් සමග වෛකල්පික විෂයයන් 4 න් 2 ක්ද සමත් විය යුතුය. විෂයයන් හැඳින්වීම, අරමුණු සහ විෂය අන්තර්ගතයන් පහත දැක්වේ.

## 1. මූල්‍ය පද්ධතිය සමීක්ෂණය

### I. විෂය හැඳින්වීම සහ අරමුණු

බැංකු සහ මූල්‍ය මෙහෙයුම් සිදු වනුයේ මූල්‍ය පද්ධතිය, එනම් මුදල් ගනුදෙනු පද්ධතිය තුළය. මූල්‍ය පද්ධතියේ පදනම් සංරචකයන් සමුදාය, මුදල්, මහ බැංකුව, මූල්‍ය ආයතන, මූල්‍ය වෙළෙඳපොළ, ගෙවීම් පද්ධති සහ මූල්‍ය ආරක්ෂක ජාල වලින් සමන්විත වේ. මූල්‍ය පද්ධතිය, මූල්‍ය සේවා සපයමින් ආර්ථික ක්‍රියාවලීන් සඳහා පහසුකම් සම්පාදනය කරයි. එබැවින්, මූර්ත (භාණ්ඩ, සේවා, සාධක) ප්‍රවාහයන් සහ මූල්‍ය ප්‍රවාහයන් අතර පවත්නා අන්තර් ක්‍රියාකාරීත්වය රටක සමස්ත සාර්ව ආර්ථික කාර්ය සාධනය තීරණය කරනු ලබන ප්‍රධාන සාධකයකි. ඒ අනුව, බැංකු සහ මූල්‍ය ක්ෂේත්‍රයේ ශිෂ්‍යයින් හට ඔවුන්ගේ වෘත්තීය ජීවිතය තුළ විශේෂිත විෂය පථයක් තෝරා ගැනීමේ හැකියාව ලැබීමට නම් ප්‍රථමයෙන් ම මූල්‍ය පද්ධතියේ මෙහෙයුම්

යන්ත්‍රණය පිළිබඳ අවබෝධය තිබිය යුතු ය. එම නිසා බැංකු සහ මූල්‍ය අංශයන් හි වෘත්තිකයින්ට යහපත් කාර්ය සාධනයක් පවත්වා ගැනීමටත් වෘත්තීය අභිවෘද්ධිය ළඟා කර ගැනීමටත් හැකිවන පරිදි සුදුසු විශේෂිත විෂය පථයක් තේරුම් ගැනීමට හා තෝරා ගැනීමට මෙන්ම ආර්ථිකයක මූල්‍ය පද්ධතියේ පුළුල් ක්‍රියාකාරිත්වයේ ව්‍යුහය හඳුනාගැනීමට ද අවශ්‍ය දැනුම ලබා දීම සඳහා මෙම විෂයය සැලසුම් කොට ඇත.

## II . නිර්දේශිත විෂය අන්තර්ගතය

(i) ආර්ථිකය තුළ මූල්‍ය පද්ධතියේ භූමිකාව

(ii) මුදල්: විකාශනය, කාර්යයන්, මුද්‍රණය, මුදල් සැපයුම සහ මුදලට ඇති ඉල්ලුම

(iii) ගෙවීම් උපකරණ සහ පියවුම් පද්ධති: ව්‍යවහාර මුදල්, චෙක්පත්, ගෙවීම් කාඩ්පත්, ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය (SLIPS), චෙක්පත් නිෂ්කාශනය සහ පිළිබිඹු, තත්කාලීන දළ ගෙවීම් පද්ධතිය (RTGS), ජාත්‍යන්තර අරමුදල්/ප්‍රේෂණය, පැවරුම් පද්ධති, (SWIFT, මනි ග්‍රෑම්, වෙස්ටන් යූනියන් ආදී) විද්‍යුත්/ජංගම ගෙවීම්

(iv) මූල්‍ය වෙළෙඳපොළ සහ සුරැකුම්පත්/නිපැයුම්: තැන්පතු, සමාගම් කොටස්, බැඳුම්කර, ප්‍රති මිලදී ගැනුම් සහ ප්‍රති විකුණුම්, විදේශ විනිමය, ව්‍යුහගත මූල්‍ය, මූල්‍ය ව්‍යුත්පන්නයන්, ඒකක, ව්‍යවසායකත්ව ප්‍රාග්ධන ආයතන

(v) මූල්‍ය ආයතන: මහ බැංකුව, මූල්‍ය අතරමැදියන් (වාණිජ බැංකු, මුදල් සමාගම්, කල්බදු මූල්‍යකරණ සමාගම්, රක්ෂණ සමාගම්, ක්‍රමාරෝපිතකරණ සමාගම්, සමූපාකාර), මූල්‍ය සේවා සම්පාදකයන් (ආයෝජන බැංකු, අරමුදල් කළමනාකරණ සමාගම්, ගෙවීම් සේවා සම්පාදකයන්, මුදල් හුවමාරු කරන්නන්, අලෙවිකරුවන්, තැරැව්කරුවන්, හුවමාරුපොලවල්, සුරැකුම්පත් තැන්පත්කරුවන්)

(vi) මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය : මූල්‍ය අර්බුද (බැංකු, වෙළෙඳ පොළ සහ ණය අර්බුද), ආසියානු මූල්‍ය අර්බුදය පිළිබඳ විශ්ලේෂණය සහ මෑත කාලීන ගෝලීය මූල්‍ය අර්බුද (ස්වභාවය, හේතු සාධක, බලපෑම් සහ විසඳුම්), මූල්‍ය පද්ධතියට සම්බන්ධ වැදගත් මූල්‍ය ආයතන (විශාල ආයතන අසාර්ථක නොවී පවත්වාගෙන යාම), ඡායාස්ථ බැංකුකරණය සහ අවදානම්, මූල්‍ය ස්ථාවරත්ව රාමු

(vii) මූල්‍ය ආරක්ෂිත ජාල යාන්ත්‍රණයන්: මූල්‍ය අංශය රෙගුලාසි සම්පාදකයින් (ප්‍රාග්ධන වෙළෙඳපොළ, බැංකු, බැංකු නොවන මූල්‍ය ආයතන සහ රක්ෂණ) මූල්‍ය ස්ථාවරත්වය සඳහා නියාමකයන් සහ ඔවුන්ගේ ප්‍රධාන කාර්යභාරය සහ ප්‍රධාන උපකරණ

## 2. වාණිජ බැංකු කටයුතු

### I. විෂය හැඳින්වීම සහ අරමුණු

වාණිජ බැංකු කටයුතු පොදු ජනතාවගේ දෛනික ජීවිතයේ දේශීය සහ විදේශීය ආර්ථික ගනුදෙනුවලදී විවිධ ආකාරයන්ගෙන් සම්බන්ධ වෙමින් පහසුකම් සම්පාදනය කරනු ලබයි. වාණිජ බැංකු මුදලේ ආර්ථික ක්‍රියාවලිය ඵලදායීව සහ වේගවත්ව පවත්වාගෙන යාම සඳහා මුදල් පහසුකම් සැපයීමෙන් තම මෙහෙවර ඉටු කරනු ලබයි. වාණිජ බැංකු නොමැති වී නම්, මුදලේ කාර්යයන් අතිශයින් ප්‍රාථමික සහ මුදල් මතම පදනම් ඒවා වන අතර එවැනි තත්ත්වයක් නූතන ලොව තුළ සිතීමට පවා නොහැක. සාම්ප්‍රදායිකව ගත් කළ වාණිජ බැංකු ආර්ථික ක්‍රමයේ මූල්‍ය කටයුතු තුළ කේන්ද්‍රීය සංරචකයක් වේ. වාණිජ බැංකු පොදු ජනතාවගේ එදිනෙදා ආර්ථික කටයුතු සඳහා පහසුකම් සලසමින්, නව්‍ය නිපයුම් හඳුන්වා දෙමින් ක්‍රමයෙන් විකාශනය වෙමින් පවතී. මෙම නිපැයුම්, මූල්‍ය කටයුතුවල සියලුම අංශයන්ට මුළුමනින්ම සම්බන්ධ වී ඇත. එනම් ඉතුරුම් රැස් කිරීම, ණය අයදුම්කරුවන්ට සහ ආයෝජකයන්ට අරමුදල් සම්පාදනය කිරීම, සහ දේශීය සහ ජාත්‍යන්තර වශයෙන් මූල්‍ය ගනුදෙනු සේවා සම්පාදනයන් යනාදිය මගිනි. මූල්‍ය පද්ධතියේ ක්‍රමානුකූලත්වය සඳහා වානිජ්‍ය බැංකුවල ඇති වැදගත්කම සලකා රජය විසින් මෙම සියලු මූල්‍ය සේවා සම්පාදනයන් නියාමනයට සහ අධීක්ෂණයට යටත්

කොට ඇත. මූලික වශයෙන් රටක ආර්ථික ස්ථායිතාව සහ මූල්‍යමය ස්ථාවරත්වය යන අංශ දෙක සඳහා වාණිජ බැංකු කටයුතු ස්ථායිතාව බෙහෙවින් බලපාන අතර ඒ සඳහා පහසුකම් සම්පාදනය ද වානිජ බැංකු මගින් කරනු ලබයි. එම නිසා, බැංකු සහ මූල්‍ය අංශයේ වෘත්තිකයන්ට බැංකුවක ඕනෑම අංශයක සඵලදායී ලෙස සේවා සැපයීම සහ කටයුතු කිරීම සඳහා වාණිජ බැංකු ව්‍යාපාරික මෙහෙයුම් කටයුතු පිළිබඳව අවශ්‍ය මූලික දැනුම සම්පාදනය කිරීමේ අපේක්ෂාවෙන් මෙම විෂය සැලසුම් කොට ඇත.

## II . නිර්දේශිත විෂය අන්තර්ගතය

(i) බැංකු කටයුතුවල පරිණාමය : රන්කරුවන්, රන් ප්‍රමිතීන් සහ බැංකු නෝට්ටු

(ii) බැංකු ව්‍යාපාරික ක්‍රියාමාර්ග : අරමුදල් පාදක සහ සේවා ගාස්තු පාදක ව්‍යාපාර කටයුතු

- අරමුදල් පාදක : තැන්පතු රැස් කිරීම (ජංගම, ඉතුරුම්, කාලීන තැන්පතු ගිණුම් ආදිය), චෙක්පත් සහ නිශ්කාශන සේවා, ණය ප්‍රදානය (අයිරා, කාලීන ණය, වෙළෙඳ මූල්‍යකරණය, ණය කාඩ්පත් ආදිය), ණය ගැනීම (අන්තර් බැංකු, ණය පත්‍රිකා, ප්‍රති මිලදීගැනීම්), සහ ආයෝජන.
- සේවා ගාස්තු පාදක : වගකීම් සහ අවිනිශ්චිතතා, ගෙවීම් සහ ආයෝජන සේවාවන්

(iii) බලය ලත් අලෙවිකරුවන් /විදේශීය විනිමය මෙහෙයුම් : විදේශීය ව්‍යාපාරික කටයුතු සම්බන්ධව නේවාසික සහ අනේවාසික පුද්ගලයින් සඳහා තැන්පතු, විදේශීය ව්‍යවහාර මුදල්වලින් ණය දීම, මිලදී ගැනීම සහ විකිණීම (කවුන්ටරය හරහා, එතැන්, ඉදිරි, ආදිය) ප්‍රේෂණ, නොස්ට්‍රෝ ගිණුම්

(iv) බැංකු ව්‍යාපාර ආකෘති : ආයතනික බැංකු කටයුතු, සාමාන්‍ය බැංකු කටයුතු, ගනුදෙනු බැංකු කටයුතු, ජාත්‍යන්තර බැංකු කටයුතු/අක් -වෙරළ බැංකු කටයුතු, විශ්ව බැංකු කටයුතු, ඉස්ලාමීය බැංකු කටයුතු

(v) බැංකු සේවා බෙදාහැරීම් මාර්ග : ශාඛා/සේවා මධ්‍යස්ථාන, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර, අන්තර්ජාල බැංකු කටයුතු, ජංගම/ ටෙලි බැංකු කටයුතු

(vi) බැංකු කටයුතුවල ශක්තිමත් බව ඇගයීම : වත්කම්වල ගුණාත්මක බව, ද්‍රවශීලතාව, ලාභදායීත්වය නුබුන්වත් බව/ප්‍රාග්ධනය, සංවේදීතාවය සහ ශක්තිමත් බව බව නිර්ණයකරන මූලික දර්ශක අංක.

(vii) බැංකු අවදානම් කළමනාකරණය : බැංකුකරණ අවදානම් (ණය, ද්‍රවශීලතා, වෙළෙඳපල, මෙහෙයුම් සහ ක්‍රමෝපායය අවදානම් සහ අවදානම් නිර්ණායකයන්), අවදානම් කළමනාකරණ ක්‍රමෝපායයන්/මිනුම් (ණය දීමේ ප්‍රතිපත්තීන් - සීමාවන්, කමිටු, සුරැකුම්, ප්‍රතිපාදනයන්/වත්කම් හානිකරණය ආදිය. වත්කම් වගකීම් පරතර කළමනාකරණය, ද්‍රවශීල වත්කම්, අවිනිශ්චිත අවස්ථාවන් සඳහා ණය සම්පාදන මාර්ග, අභ්‍යන්තර පාලනයන්, ව්‍යාපාර අඛණ්ඩ පැවැත්ම සඳහා සැලසුම්, ප්‍රාග්ධනය)

(viii) විචක්ෂණ රෙගුලාසි සහ බැංකු අධීක්ෂණයඃ ශ්‍රී ලංකාවේ ප්‍රධාන නියාමන සහ අධීක්ෂණ මිනුම් සහ ක්‍රමවේද - බලපත්‍ර ලබා දීම, ප්‍රධාන නියාමන රෙගුලාසි (ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව, ද්‍රවශීල වත්කම් අනුපාතය, ණය වර්ගීකරණය සහ වෙන් කිරීම් , අධ්‍යක්ෂවරුන්ගේ හා නිලධාරීන්ගේ යථා යෝග්‍යතාවය සහ සුදුසුකම්, ආයතනික යහපාලනය, කොටස් හිමිකාරීත්වයේ සීමා, කොටස් හිමිකාරත්වයන්හි ආයෝජනය කිරීමේ සීමා, ණය පහසුකම් ලබා දීමේ සීමා, තැන්පතු රක්‍ෂණය, මූල්‍ය ප්‍රකාශ සහ විගණනයේ අවශ්‍යතා) අධීක්ෂණය (අවදානම් - සම්පත් පදනම් කරගත් ප්‍රවේශයට එරෙහිව CAMELS, අඛණ්ඩ/ දූරස්ථ අධීක්ෂණය, පරීක්ෂණ/ ස්ථානීය සුපරීක්ෂණයන්, කල් තබා දක්නට ලැබෙන අවවාදාත්මක සංඥා සහ ගැටලු නිරාකරණය) බාසල් සම්මුතීන් (මූලික

මූලධර්ම, බාසල් 111, ප්‍රාග්ධන අනුපාත, ද්‍රවශීලතා අනුපාතයන් සහ තෝලන අනුපාත)

(ix) ශ්‍රී ලංකාවේ මෑත කාලීන බැංකු ක්‍රමයේ ප්‍රවණතා සහ ක්‍රියාකාරිත්වයන්

(x) මෑත කාලීන ගෝලීය බැංකුකරණ ව්‍යාපාරික ප්‍රවනතාවන්, ගැටලු සහ ගෝලීය මූල්‍ය අර්බුද වලින් වන බලපෑම

## 3. ව්‍යාපාර ගිණුම්කරණය

### I. විෂය හැඳින්වීම සහ අරමුණු

පිළිගත් මූලධර්ම සහ ප්‍රමිතීන්ට අනුකූලව ව්‍යාපාරවල මූල්‍ය ප්‍රතිඵලයන් ඉදිරිපත් කිරීමේ ක්‍රමවේදය ගිණුම්කරණය යි. නිවැරදි ගිණුම්කරණ ක්‍රමවේදයන් භාවිත කිරීම මගින් ව්‍යාපාරවල යථා තත්ත්වයන් පෙන්නුම් කෙරෙනු ඇත. ව්‍යාපාරයන්හි මූල්‍ය තත්ත්වයන් සහ ගිණුම්කරණ ප්‍රමිතීන් අතර වෙනස මූල්‍ය ප්‍රකාශනවල අන්තර්ගතයන් සහ ඉදිරිපත් කිරීම් මගින් පෙන්නුම් කරනු ලබයි. ගිණුම්කරණය යනු වසර ගණනාවක න්‍යායාත්මක සහ ප්‍රායෝගික පුහුණුවක් අවශ්‍ය විශේෂිත වූ වෘත්තීයමය රැකියා ක්ෂේත්‍රයක් වේ. බැංකු සහ මූල්‍ය ආයතනයන්ට ද ගිණුම්කරණයේ වෘත්තීය සුදුසුකම් ලත්, ඒ සඳහා කැපවූ සේවකයින් අවශ්‍යය. මෙහි දී ගිණුම්කරණය වෘත්තීයමය විෂයයක් ලෙස ඉගැන්වීමට බලාපොරොත්තු නොවේ. එසේ වුවත් බැංකු හා මූල්‍ය ව්‍යාපාරවල නිරත වන වෘත්තිකයන්ට සිය සේවාදායක ආයතනයන්හි සහ ආයතනික ගනුදෙනුකරුවන්ගේ මූල්‍ය ප්‍රකාශනවල අන්තර්ගතයන් අවබෝධකර ගැනීමටත්, සහ සිය සේවා දායක ආයතන වල මූල්‍ය තත්ත්වයන් අගයමින් සිය වැඩකටයුතුවල බලපෑම සහ දායකත්වය, සිය ව්‍යාපාරික ගනුදෙනුකරුවන්ගේ ණය ලැබීමට ඇති සුදුසුකම් සහ කාර්ය සාධනය යනාදිය අවබෝධ කර ගැනීමටත් පසුබිමක් සකසා දීම මෙයින් අපේක්ෂිතය.

ව්‍යාපාරික ආයතනයන් හි මූල්‍ය ප්‍රකාශයන් අවබෝධ කර ගැනීම තුළින් ආයතනයේ මූල්‍යමය යහපත් පැවැත්ම සහ දිගුකාලීන ස්ථාවරත්වය සඳහා සිය කාර්ය භාරයෙහි වැදගත්කම පිළිබඳව සේවකයින් දැනුම්වත් වේ. එම නිසා, මෙම විෂයය මූල්‍ය සහ අනෙකුත් ව්‍යාපාර ඒකකයන් හා සම්බන්ධ ශ්‍රී ලංකා ගිණුම්කරණ

ප්‍රමිතීන් මෙන්ම අදාළ අනෙකුත් ප්‍රධාන ගිණුම්කරණ ප්‍රමිතීන් සහ නියාමන අවශ්‍යතා සම්බන්ධ දැනුමද ලබා දීම සඳහා සැලසුම් කර ඇත.

## II . නිර්දේශිත විෂය අන්තර්ගතය

(i) ව්‍යාපාරික ආයතන සහ වෙනත් පාර්ශවයන්ට අදාළ වන ගිණුම්කරණ සහ මූල්‍ය ප්‍රකාශයන් හි මූලික සංකල්ප සහ මූලධර්මඃ මූල්‍ය ගණකාධිකරණයේ අරමුණ, මුදල් හා උපචිත සංකල්ප

(ii) ලෙජර් ගිණුම් සහ ආධාරක ලේඛන සකස් කිරීම ඃ ලෙජර් ගිණුම්, බැංකු සැසඳුම්, ශේෂ පිරික්සුම් සහ බදුකරණය වැනි වෙනත් නිශ්චිත ගණකාධිකරණ සේවා කටයුතු

(iii) මූල්‍ය උපකරණ හඳුනාගැනීම සහ ගණනය කිරීම ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිති 39, වෙනත් වත්කම් (ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිති 16, 17 සහ 40) ඃ ලාභාලාභ අනුව සාධාරණ වටිනාකම නිශ්චය කළ මූල්‍ය වත්කම් සහ වගකීම්, වෙළෙඳාම පිණිස රඳවාගෙන ඇති මූල්‍ය වත්කම් සහ වගකීම්, පරිණතිය පිණිස රඳවාගෙන ඇති ආයෝජනයන්, ණය සහ ලැබිය යුතු දෑ, අය විය යුතු කල් බදු (මූල්‍ය සහ මෙහෙයුම්), දේපළ, යන්ත්‍ර සහ උපකරණ, ආයෝජන දේපළ, හානි කරන ලද සහ රැස් කළ නොහැකි මූල්‍ය වත්කම් සහ හානිකාරකයන් හඳුනා ගැනීමෙන් පසුව වන පොලී ආදායම්

(iv) මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම හඳුන්වා දීම සහ මූල්‍ය උපකරණවල තොරතුරු හෙළිදරව් කිරීම (මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, සමස්ත විස්තීරණ ආදායම, මූල්‍ය ප්‍රවාහ සහ හිමිකාරිත්වයේ වෙනස් වීම්) කේවල ස්වාමී ව්‍යාපාර, හවුල් ව්‍යාපාර, සීමිත වගකීම් සහිත සමාගම්, නිෂ්පාදන සමාගම්, වෙනත් (ලාභ පිණිස නොවන සංවිධාන (NPOs), සමාජ ශාලා සහ සංගම්)

(v) මූල්‍ය ආයතන වල මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම, ඉදිරිපත් කිරීම සහ අවබෝධ කර ගැනීම (බැංකු, මුදල් සමාගම්, රක්ෂණ සමාගම්), බැංකු පනත, මුදල් ව්‍යාපාර පනත, රක්ෂණ ව්‍යාපාරයට අදාළ නියාමන පනත, සුරැකුම්පත් සහ විනිමය කොමිසන් සභා පනත සහ සමාගම් පනත අනුව පනවා ඇති ව්‍යවස්ථාපිත අවශ්‍යතාවන් සහ ශ්‍රී ලංකා ගණකාධිකරණ සහ විගණන ප්‍රමිති පනතේ දැක්වෙන විධි විධානයන්.

## 4. බැංකු සහ මූල්‍ය නීතිය හැඳින්වීම

### I. විෂය හැඳින්වීම සහ අරමුණු

බැංකු සහ මූල්‍ය ක්ෂේත්‍රයට අදාළ නීති විවිධාකාර මෙන්ම සංකීර්ණද වන අතර මෙම නීති පිළිබඳව විශාරදත්වය ලබනු පිණිස නීති වෘත්තිකයින් ජීවිත කාලය පුරා අධ්‍යයනයේ යෙදෙමින් පරිචය ලැබීම අවශ්‍යය. එම නිසා බැංකු සහ මූල්‍ය නීති කෙටි කාලසීමාවක දී එක් විෂයයක් වශයෙන් හැදෑරීම අපහසු ය. නීති පද්ධතිය, මූල්‍යමය ගනුදෙනු/නිපැයුම්වලට අදාළ නීති මූලධර්ම, මූල්‍ය ගනුදෙනුවල සුරක්ෂිතතාවය සහ මූල්‍ය ගනුදෙනුවල නෛතිකත්වය සියලුම මූල්‍ය ව්‍යාපාරයන්ට අදාළ වන පොදු නෛතික කරුණු වේ. සිය රාජකාරී කටයුතු අදාළ නීතීන්ට අනුකූලව ඉටු කරනු පිණිස සහ, ව්‍යාපාර මෙහෙයුම්වල දී මුහුණ දීමට සිදු වන ගැටළු සඳහා විශේෂඥ නීති උපදෙස් ලබා ගනු පිණිස සියලු බැංකු සහ මූල්‍ය වෘත්තිකයින්, මෙම නෛතික කරුණු පිළිබඳව දැනුම්වත් විය යුතුය. එම නිසා මෙම විෂයය බැංකු සහ මූල්‍ය ව්‍යාපාර වලදී අවශ්‍ය කරන මූලික නීතිමය පදනම ලබා දීම සඳහා සැලසුම් කොට ඇත. බැංකු සහ මූල්‍ය කටයුතු සඳහා නිරන්තරව අදාළ වන නීතිවල වැදගත් අංශ මෙම පාඨමාලාවේ වෙනත් අදාළ විෂයයන් යටතේද ආවරණය කෙරෙනු ඇත.

### II . නිර්දේශිත විෂය අන්තර්ගතය

(i) හැඳින්වීම : ශ්‍රී ලංකාවේ නීති පද්ධතිය (නීති මූලාශ්‍ර - ව්‍යවස්ථාව, රෝම ලන්දේසි නීතිය, ඉංග්‍රීසි නීතිය සහ චාරිත්‍රානුකූල නීති, උසාවි පද්ධතිය, අධිකරණ පූර්වාදර්ශ, ව්‍යවස්ථා අර්ථකතනයන්), ගිවිසුම් නීතිය (ගිවිසුමක ස්වභාවය සහ ලක්ෂණ, ගිවිසුමක් ඇති වීම, ගිවිසුමක මූලික කරුණු,

ගිවිසුමක් අවසන් කිරීම) සහ බැංකුකරු හා ගනුදෙනුකරු අතර සම්බන්ධතාව, නිර්වචන, සම්බන්ධතා ආරම්භය සහ අවසන් කිරීම,

(ii) බැංකුකරුගේ යුතුකම් සහ වගකීම් (රහස්‍යතාව රැකීමේ යුතුකම ද ඇතුළුව), ගනුදෙනුකරුවන් යුතුකම් සහ වගකීම්, නියෝජිතයෙකු, භාරකරුවෙකු සහ මුදල් භාරකරුවෙකු, අනුප්‍රාප්තිකයෙකු (නම් කිරීම, අන්තිම කැමති පත්‍ර ඇති සහ නැති) වශයෙන් බැංකුකරුගේ භූමිකාව

(iii) ගනුදෙනු කළ හැකි ලියවිලි : නිර්වචනයන්, පාර්ශව කරුවන්ගේ වගකීම් සහ චෙක්පත් (ගනුදෙනු කළ හැකි බව, රේඛන, අපවර්තනය ආදිය)

(iv) විද්‍යුත් ගනුදෙනු : විද්‍යුත් ගනුදෙනු හඳුනා ගැනීම, චෙක්පත් ප්‍රතිරූපනය සහ පිළිබිඹු, සිල්ලර ගෙවීම් පද්ධති, විශාල වටිනාකම සහිත ගෙවීම් පද්ධති සහ නිර්ලේඛන සුරැකුම්පත්

(v) සුරැකුම්: වර්ග, (චංචල/නිශ්චල) සහ සුරැකුම් ලියවිලි

(vi) ණය අය කිරීම : උකස් නඩු ණය අය කිරීම් (විශේෂ ප්‍රතිපාදන) පනත සහ බැංකු මඟින් ප්‍රදානිත ණය අය කිරීම් (විශේෂ ප්‍රතිපාදන පනත)

(vii) පාරිභෝගික ආරක්ෂණයන්: ව්‍යවස්ථාපිතමය ප්‍රතිකර්ම, පොදු නීතිය යටතේ ප්‍රතිකර්ම සහ ආයතනික/පරිපාලනමය විධිවිධානයන්

(viii) ඔබගේ ගනුදෙනුකරු හඳුනාගැනීමේ (KYC) අවශ්‍යතා : මුදල් විශුද්ධිකරණ පරිචයන්/දර්ශවාදයන්, මුදල් විශුද්ධිකරණයට එරෙහි නීති සහ ත්‍රස්තවාදය වැළැක්වීමේ මූල්‍ය නීති, මූල්‍ය ගනුදෙනු වාර්තාකරණ පනතේ වැදගත් ප්‍රතිපාදනයන්, මූල්‍ය බුද්ධිමය සහ ක්‍රියාවලීන්/ක්‍රියාදාමයන් සහ KYC/CDD ක්‍රියාපටිපාටි සහ ගෝලීය ප්‍රමිතීන් සහ මෙහෙයුම් (FATF නිර්දේශයන්)

## 5. ආර්ථික විද්‍යා මූලධර්ම (වෛකල්පික)

### I. විෂය හැඳින්වීම සහ අරමුණු

බැංකු හා මූල්‍ය ව්‍යාපාර සහ ආර්ථික කටයුතු අතර අන්තර් සම්බන්ධතාවක් සහ අන්තර් රැඳියාවක් පවතින හෙයින් බැංකු සහ මූල්‍ය වෘත්තිකයන්ට ගනුදෙනුකරුවන්ගේ සහ ආර්ථික ක්‍රමයේ හැසිරීම පිළිබඳව අවබෝධයක් තිබිය යුතුය. තව ද, බැංකු සහ මූල්‍ය ව්‍යාපාර කටයුතු ආර්ථක විද්‍යා මූලධර්මයන් අදාළ වන ආර්ථික ක්‍රියාවලියන් හි අංශයක් ද වේ.

කෙසේ වුවත්, ආර්ථික විද්‍යාව පුළුල් විෂයයක් මෙන්ම කැප වුණු වෘත්තියක් ද වේ. ව්‍යාපාරික තීරණයන්ට එළඹීමේ දී සාමාන්‍යයෙන් සිදුවනුයේ ආර්ථික පර්යේෂණයන් මඟින් පහසුකම් සම්පාදනය පිණිස විශාල බැංකු සහ මූල්‍යායතන විසින් අර්ථ ශාස්ත්‍රාඥයන් කිහිප දෙනෙකුගේ සේවය ලබා ගැනීමයි. එලෙස වැදගත් වන මෙම විෂයය, ක්ෂුද්‍ර සහ සාර්ව ආර්ථික විද්‍යා සිද්ධාන්ත, ජාත්‍යන්තර අර්ථික විද්‍යාව, වර්ධනය හා සංවර්ධනය සහ මූලික මට්ටම්වල ආර්ථික විශ්ලේෂණයන් වැනි තෝරා ගත් මූලික මූලධර්මයන් පිළිබඳ දැනුම සම්පාදනය කිරීම පිණිස සැලසුම් කොට ඇත. බැංකු සහ මූල්‍ය වෘත්තිකයන්ගේ රැකියා මාර්ග ප්‍රවර්ධනය පිණිස ආර්ථ ශාස්ත්‍රීය මූලධර්ම පිළිබඳ අවබෝධය බෙහෙවින් උපකාරී වේ.

### II . නිර්දේශිත විෂය අන්තර්ගතය

(i) ආර්ථික විද්‍යාවේ මූලික සංකල්පයන් : ආර්ථික සම්පත්, මූලික ආර්ථික ප්‍රශ්න (හිඟකම සහ තෝරා ගැනීම), ආවස්ථික පිරිවැය, මූලික ආර්ථික ක්‍රියාවලීන් (නිෂ්පාදනය සහ පරිභෝජනය)

(ii) ක්ෂුද්‍ර ආර්ථික විද්‍යාව : පාරිභෝගික හැසිරීම (උපයෝගීතාව, උපේක්ෂා වක්‍ර විශ්ලේෂණය, ප්‍රකාශිත වරණය, ඉල්ලුම් න්‍යාය, ඉල්ලුම් නම්‍යතාව සහ එහි ප්‍රායෝගිකත්වය) නිෂ්පාදකයාගේ හැසිරීම (නිෂ්පාදනය, ඵලදායීතාව, පිරිවැය සහ ලාභ උපරිමය, සැපයුම් න්‍යාය), වෙළෙඳ පොළ යාන්ත්‍රණය

සහ රාජ්‍ය මැදිහත්වීම, වෙළෙඳ පොළ ව්‍යුහය (පූර්ණ තරගය, ඒකාධිකාරය, අපූර්ණ තරගය, ඒකාධිකාරී තරගය සහ කතිපයාධිකාරය)

(iii) සාර්ව ආර්ථික විද්‍යාව ආදායම් චක්‍රීය ප්‍රවාහය , සංකල්ප සහ නිමැවුම් ඇස්තමේන්තු, ආදායම සහ වියදම, පාරිභෝජනය, ආයෝජනය, ඉතිරි කිරීම්, රාජ්‍ය අයවැය

(iv) සාර්ව ආර්ථික සමතුලිතය : ජාතික ආදායමේ ස්වභාවය, ආදායම් සමතුලිතය සහ ආදායම් ගුණකය, IS-LM රාමුව සහ ආදායම සහ වියදම කෙරෙහි මූල්‍ය සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිවල බලපෑම

(v) ජාත්‍යන්තර ආර්ථික විද්‍යාව
ජාත්‍යන්තර වෙළෙඳාම් මූලික න්‍යායයන් (වාණිජවාදය, නිරපේක්ෂ වාසි, සාපේක්ෂ වාසි සහ Heckscher Ohlin Theory සහ නව දර්ශනයන්), ගෙවුම් ශේෂය විශ්ලේෂණය (ජංගම ගිණුම, ප්‍රාග්ධන හා මූල්‍ය ගිණුම සහ හිඟය මූල්‍යකරණය කිරීම) විනිමය අනුපාත ක්‍රමවේද, ජාත්‍යන්තර සංචිත, ජාත්‍යන්තර ප්‍රාග්ධන ප්‍රවාහයන්, ජංගම සහ ප්‍රාග්ධන ගිණුම් ගනුදෙනු සම්බන්ධව විනිමය පාලන නිදහස් කරලීම

(vi) ආර්ථික වර්ධනය සහ සංවර්ධනයː රොස්ටෝ සහ හැරල්ඩ් ඩුමාර්, ආදී න්‍යාය/සංකල්ප ව්‍යාපාර චක්‍ර, වර්ධන ප්‍රතිපත්තීන් සහ ක්‍රමෝපායයන් (අපනයන ප්‍රවර්ධනය, ආනයන ආදේශනය, විදේශ ආයෝජනයන්, ව්‍යාපාරික කේන්ද්‍ර, අක්වෙරළ මූල්‍ය මධ්‍යස්ථාන), ලෝක බැංකුවේ හා ආසියානු සංවර්ධන බැංකුවේ කාර්යභාරයන් ආදී න්‍යායයන් සහ සංකල්පයන්

(vii) ප්‍රධාන සාර්ව ආර්ථික දර්ශකයන් උද්ධමනය, ආර්ථික වර්ධන අනුපාතය, ඒක පුද්ගල ආදායම, ඉතිරි කිරීම් සහ ආයෝජන අනුපාත, අයවැය හිඟය, රාජ්‍ය ණය අනුපාතය, ශ්‍රම බලකාය සහ රැකියා වියුක්තිය, ආදායම් ව්‍යාප්තියේ විෂමතා, ගෙවුම් ශේෂයේ ජංගම ගිණුම් ශේෂය, වෙළෙඳ

අනුපාතය, පොලී අනුපාත (පදනම් අනුපාත), විනිමය අනුපාත, මුදල් සැපයුමේ වර්ධනය සහ ඒවායේ අන්තර් සම්බන්ධතාවන්

(viii) නිදහස ලැබීමේ සිට ශ්‍රී ලංකාවේ ආර්ථිකය පිළිබඳ විශ්ලේෂණය, ප්‍රධාන ප්‍රවනතා, ප්‍රතිපත්තිමය වෙනස් වීම් සහ මධ්‍ය කාලීන දර්ශනයන් සහ අභියෝගයන්

## 6. බැංකු නොවන මූල්‍ය ව්‍යාපාර කටයුතු (වෛකල්පික)

### I. විෂය හැඳින්වීම සහ අරමුණු

බැංකු නොවන මූල්‍ය ව්‍යාපාර කටයුතු හෙවත් ඡායාස්ථ බැංකු කටයුතුවල යෙදෙන ආයතනයන් විශේෂිත මූල්‍ය සේවාවන් ද ඇතුළුව, ගනුදෙනුකරුවන්ගේ සිය මූල්‍ය කළමනාකරණය වෙනුවෙන් විවිධ අරමුණු ඇතිව සහ විවිධ මට්ටම්වල අවදානම් දරමින් මූල්‍ය සේවාවන් සම්පාදනය කරනු ලබයි. ඒවාට අදාළ මූල්‍යමය නීති සහ පරිචයන් අනුව මෙම ආයතන වර්ග රටින් රටට විවිධ වේ. බැංකු මෙන් නොව, විවිධ මාදිලියේ ව්‍යාපාර ආකෘතීන්ට අනුව මෙම මූල්‍ය ආයතන විශාල සංඛ්‍යාවක් ක්‍රියාත්මක වේ. මෙම ආයතන විසින් ගනුදෙනුකරුවන්ට ඉතුරුම්, මූල්‍යකරණයන්, ආයෝජනයන්, ගෙවීම් පද්ධති, ආයෝජන සේවාවන්, වෙළෙඳපොල සේවා සහ අවදානම් ආවරණයන් යනාදී සේවාවන් සම්පාදනය කරනු ලබයි. එම නිසා මෙම විෂයය බැංකු සහ මූල්‍ය වෘත්තිකයන්ට බැංකු අනුපූරක හෝ තරගකාරී වන ප්‍රධාන මූල්‍ය ව්‍යාපාර ක්ෂේත්‍රයන් පිළිබඳ දැනුම සම්පාදනය සඳහා සැලසුම් කොට ඇත. කෙසේ වුවත්, ආයෝජන බැංකු කටයුතු, එනම් ප්‍රධාන බැංකු නොවන මූල්‍ය කටයුතු සහ සංවර්ධන මූල්‍ය, එනම් දිගු කාලීන ණය දීමේ ව්‍යාපෘති, මෙම පාඨමාලාවේ ව්‍යවහාරික බැංකු සහ මූල්‍ය ඩිප්ලෝමා පාඨමාලාව (DABF) යටතේ වෙනම විෂයයන් වශයෙන් ඇතුළත් කර ඇත්තේ ඒවායේ ඇති විශේෂිත ව්‍යාපාරික වැදගත්කම් හේතුවෙනි.

## II . නිර්දේශිත විෂය අන්තර්ගතය

(i) මූල්‍ය ව්‍යාපාර : මුදල් සමාගම් සහ ඒවායේ ව්‍යාපාරික නිපැයුම් (කාලීන සහ ඉතුරුම් තැන්පතු, දේපළ වෙළෙඳාම, කුලී සින්නක්කර, උකස්, කාලීන ණය) නියාමන සහ අධීක්ෂණ ක්‍රියාමාර්ගයන් (බලපත්‍ර ලබා දීම, ප්‍රාග්ධන අරමුදල, අවදානම් මත බර තැබූ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය, අවම මූලික ප්‍රාග්ධනය, ව්‍යුහාත්මක වෙනස්කම් සහ අඩමාන ණය වෙන් කිරීම, කේවල ණය සීමා, ණය දීම, ආයෝජන, ද්‍රවශීල වත්කම්, තැන්පතු, අධ්‍යක්ෂකවරුන් සහ ඔවුන්ගේ ඥාතීන් සමඟ ව්‍යාපාර ගනුදෙනු, පොළී අනුපාත, ආයතනික යහපාලනය, අධ්‍යක්ෂවරුන් සහ නිලධාරීන්ගේ යෝග්‍යතාව පිළිබඳ තක්සේරු වෙළෙඳ දැන්වීම්, තැන්පතු රක්ෂණය)

(ii) කල්බදු මූල්‍යකරණ ව්‍යාපාර : කල්බදු මූල්‍ය සමාගම් කල්බදුකරණයේ මෙහෙයම් කටයුතු , පොරොන්දු නෝට්ටු මගින් ණය ගැනීම, නියාමන සහ අධීක්ෂණ ක්‍රියාමාර්ග

(iii) ගෙවීම් සේවා ව්‍යාපාර : කාඩ්පත් ගෙවීම්, ජංගම දුරකතන ගෙවීම්, ප්‍රේෂණ නියෝජිතයන්, මුදල් මාරු කරන්නන්, විධිමත්කරණ සහ අධීක්ෂණ ක්‍රියාමාර්ග

(iv) සමූපකාර : තැන්පතු භාර ගැනීම, සාමාජිකයින්ට ණය දීම, සමූපකාර නීතියේ ප්‍රධාන ප්‍රතිපාදන සහ අධීක්ෂණ රාමුව

(v) උකස් ව්‍යාපාර : උකස් පරිචයන්, ලියාපදිංචි කිරීමේ අවශ්‍යතා, රන් වෙළෙඳපොළ ප්‍රවනතා

(vi) සුරැකුම්පත් වෙළෙඳ සේවා ව්‍යාපාර : හුවමාරු, මුදල් තැරැව්කරුවන්, කොටස් තැරැව්කරුවන්, ආයෝජන කළමනාකරුවන්, ආන්තික සම්පාදකයන්, ක්‍රමාරෝපිතකරණ සමාගම්, ප්‍රාරක්ෂකයන්, රාජ්‍ය

සුරැකුම්පත්වල ප්‍රාථමික අලෙවිකරුවන්, සුරැකුම්පත් තැන්පත්කරුවන්, නියාමන සහ අධීක්ෂණ ක්‍රියාදාමයන් (බලපත්‍ර ලබා ගැනීම, අවම ශුද්ධ ප්‍රාග්ධනය සහ විනිමය සඳහා ද්‍රවශීල ප්‍රාග්ධන අවශ්‍යතා, කොටස් තැරැව්කරුවන්, ඒකක භාර කළමනාකරණ සමාගම්, වෙළෙඳපොළ අතරමැදිකරුවන් සහ ණය ශ්‍රේණිගත කිරීමේ නියෝජිතයන්, අභ්‍යන්තර වෙළෙඳාම් හානි පූරණ අරමුදල්, මුදල් තැරැව්කරණයට අදාළ නියාමනයන්)

(vii) රක්ෂණ ව්‍යාපාර : පොදු, ජීවිත සහ ඒකාබද්ධ නිමැවුම්, නියාමන සහ අධීක්ෂණ ක්‍රියා පිළිවෙළ, (බලපත්‍ර ලබා දීම, ව්‍යවස්ථාපිත නුබුන්වත් ආන්තිකයන්, අවම නියාමන ප්‍රාග්ධනය, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර සඳහා තාක්ෂණික සංචිත, දිගුකාලීන රක්ෂණ අරමුදල්, රජයේ සුරකුම්පත්වල ආයෝජන)

(viii) ව්‍යවසායකත්ව ප්‍රාග්ධන සමාගම් : නව ව්‍යවසායකත්වයන් සඳහා ආරම්භක/ බීජ ප්‍රාග්ධන සම්පාදනය, ව්‍යාපාර කළමනාකරණය අවදානම් භාර ගැනීම සහ ලාභ ලබන අවදියේ දී ලැයිස්තු ගත කර ආයෝජනය අය කර ගැනීම, ව්‍යවසායකත්ව ප්‍රාග්ධන ආයතන වල සාර්ථක රටවල්වල කතාන්තර සහ ආර්ථික වැදගත්කම

## 7. මූල්‍ය ගනුදෙනුකරුවන් කළමනාකරණය (වෛකල්පික)

### I. විෂය හැඳින්වීම සහ අරමුණු

බැංකු සහ මූල්‍ය ව්‍යාපාරවල පැවැත්මට ගනුදෙනුකරුවන්ගේ විශ්වාසය සහ රහස්‍ය භාවය තීරණාත්මක සාධකයක් වේ. ගනුදෙනුකරුවන්ගේ විශ්වාසය බිඳ වැටීම යම් ආයතනයක කඩා වැටීමට මෙන්ම එම ආයතනය හා සම්බන්ධ ආයතන සමූහයේ ම බිඳ වැටීමට හේතු වන බව, බැංකු සහ මූල්‍ය අර්බුදවල දී දක්නට ලැබුණි. අනෙක් අතට, විවිධ අවදානම් වලට ගැළපෙන අයුරින් විවිධ ගනුදෙනුකරුවන්ට විශේෂිත වූ නිපැයුම් ඉදිරිපත් කරමින් ව්‍යාපාර ප්‍රවර්ධන කටයුතු ද කිරීම අවශ්‍ය වේ. එම නිසා ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා සැපිරීමේ දී අලෙවිකරණ, මානව සම්පත්-සේවක කළමනාකරණ මෙන්ම ගනුදෙනුකරුවන් ආරක්ෂා කර ගැනීමට අදාළ වන සදාචාරාත්මක ප්‍රමිතීන් සහ පරිචයන්ද අවශ්‍ය වේ. ලාභය ප්‍රමුඛ

කරගෙන සිදුකෙරෙන නිෂ්පාදිත අලෙවියේ දී රැවටීමට ලක් කර ගනුදෙනුකරුවන් හැසිරවීම ආයතනයේ කීර්තියට හානි වියහැකි අතර නීතිමය ගැටළු බොහොමයකටද මඟ පාදයි. මේ සම්බන්ධයෙන් බොහෝ ගනුදෙනුකරුවන් සැලකිලිමත් වේ. එම නිසා මූල්‍ය ආයතනයන්හි දිගුකාලීන තිරසාර පැවැත්ම පිණිස ගනුදෙනුකරුවන් කෙරෙහි වන සේවකයින්ගේ යහ පැවැත්ම ප්‍රවර්ධනය කළ යුතුය. ගනුදෙනුකරුවන් කළමනාකරණය සඳහා ප්‍රායෝගිකව යෙදීම, කැපවීම සහ විවිධ අවදානම් සහිත ගනුදෙනුකරුවන්ගේ සේවා කටයුතු කෙරෙහි පළපුරුද්ද අවශ්‍ය වන අතර එය සම්පූර්ණයෙන්ම පෙළ පොත් මඟින් ඉගෙනීම අපහසු වේ. කෙසේ වෙතත්, පෙළ පොත් පදනම් කරගත් උගැන්වීම් තුළින් මූලධර්ම, පරිචයන් , ගැටලු අධ්‍යයනයන් සහ වෘත්තිකයන්ගේ අදහස් ආදිය ලබා දිය හැකිය. එම නිසා, මෙම විෂය නිර්මාණය කර ඇත්තේ මූල්‍ය ගනුදෙනුකරුවන් කළමනාකරණය කිරීම සහ ඔවුන්ගේ ඉහළ කාර්යසාධනයත්, ආයතනයේ වෙළෙඳපල භාගය ප්‍රවර්ධනය කිරීම සඳහා බැංකු හා මූල්‍ය සේවාදායකයන්ගේ වෘත්තිකයින්ට අවශ්‍ය දැනුම ලබා දීමටය.

## II . නිර්දේශිත විෂය අන්තර්ගතය

(i) මූල්‍ය ගනුදෙනුකරුවන්ගේ වර්ග : තැන්පත්කරුවන්, ණයකරුවන්, ආයෝජකයන්, ගෙවීම් සේවා ගනුදෙනුකරුවන්, ඔවුන්ගේ අවදානම් රුචිය (අවදානමට අකැමති, අවදානමට කැමති) සහ ඔවුන්ගේ බැංකු සහ මූල්‍යායතන කෙරෙහි ඇති වගකීම්

(ii) ගනුදෙනුකරුවන්ගේ විශ්වාසය කළමනාකරණය : ගනුදෙනු අතර රහස්‍ය බව/විශ්වාසය මූල්‍ය ව්‍යාපාරයන්ට සහ මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වයට ඇති වැදගත්කම, තරඟකාරී වෙළෙඳපලවල තෝරා ගැනීම සහ ස්වාධිපත්‍යය, ගනුදෙනුකාර සබඳතා ගොඩනැගීම සහ පවත්වාගෙන යාම, විශේෂිත වූ මූල්‍ය සේවා (කවුන්ටරය හරහා සපයනු ලබන මූල්‍ය සේවා) විවෘත/පොදු මූල්‍ය සේවා, නව්‍ය/සංකීර්ණ මූල්‍ය සේවා, අවදානම් සහ විස්තර, නිපැයුම්වල විනිවිද බව සහ නිපැයුම් අවදානම්, ගිවිසුම් අත්සන් කිරීම සහ ලිපි ලේඛන පවත්වාගෙන යාම

(iii) මූල්‍ය නිපැයුම් අලෙවිකරණය : අලෙවිකරණ මූලධර්ම, අලෙවිකරණ විග්‍රහය, (නිපැයුම්, ප්‍රවර්ධන, මිල, ගනුදෙනුකරුවන්, භෞතික පෙනුම, ක්‍රියාවලි, ස්ථාන ආදිය) අලෙවිකරණ සැලැස්මක මූලික කරුණු (අරමුණු, ඉලක්ක, පරිසර විශ්ලේෂණ සහ වටිනාකම් දාම විශ්ලේෂණය, අලෙවිකරණ උපායමාර්ග, සැලසුම් ක්‍රියාත්මක කිරීම) අලෙවිකරණ මාර්ග (තමන් විසින්, බාහිර ආයතනවලින් සහය ලබාගැනීම, ප්‍රචාරණය, මිල විශේෂණය, වටිනාකම් එකතු කිරීමේ සේවා මඟින් ගනුදෙනුකරුවන් ලබා ගැනීම, ප්‍රදර්ශන, නියෝජිතයන්, බෙදාහරින්නන්, අන්තර්ජාල/විද්‍යුත් තැපැල්, සමාජ ජාල පදනම් කර ගත් ක්‍රමවේද ආදිය...) වෙළෙඳ පොළ සමීක්ෂණ (ගනුදෙනුකරුවන්ගේ තෘප්තිමත්භාවය පිළිබඳව, නව නිපැයුම් සහ වෙළෙඳපොළ භාගය පිළිබඳව), සමීක්ෂණ ක්‍රමවේද සහ සමීක්ෂණ වාර්තා.

(iv) ගනුදෙනුකාර සේවාවන් කාර්යක්ෂම ලෙස සම්පාදනය කිරීම සහ විශ්වාසය ජනිත කරමින් බැංකු සහ වෙනත් මූල්‍යායතනවල ස්ථාවරත්වය පිණිස මානව සම්පත් කළමනාකරණය යොදා ගැනීම : ආයතනවල ගනුදෙනුකාර ප්‍රමුඛත්වය හෝ සේවක ප්‍රමුඛත්වය, ගනුදෙනුකරුවන් සඳහා සහ ආයතනික කළමනාකරණය ව්‍යාපාර අංශ අනුව මානව සම්පත් ඇස්තමේන්තු කිරීම, සදාචාරාත්මක මූල්‍ය නිපැයුම් බෙදා හැරීම සඳහා රැකියා විස්තර සහ කාර්යය බෙදා දීම, රැකියා සඳහා තෝරා ගැනීම සහ බඳවා ගැනීමේ ක්‍රියාවලි, සේවක ගිවිසගැනීම්, ආයෝජනය (පුහුණු සහ මානව සම්පත් සංවර්ධනය/දක්ෂතා පරතරයන් විශ්ලේෂණය සහ රැකියා සැලසුම් සහායයන්), සේවක දීමනා ක්‍රම, (වැටුප් නිර්ණයන් සහ දිරිගැන්වීම් ක්‍රම) අනුප්‍රාප්තික සැලසුම්කරණය, කාර්ය සාධන ඇගයීම් ක්‍රම, ඵලදායීතා සංකල්ප, මිනුම් සහ දුක් ගැනවිලි සම්බන්ධව කටයුතු කිරීම සහ උපදේශන කාර්ය පටිපාටි, කණ්ඩායම් වැඩ කටයුතු සහ පුද්ගල වගකීම්, රැකියා අවංකභාවය සහ අභ්‍යන්තර පාලන ක්‍රමවේද සමඟ අදාළත්වය, විනය ක්‍රියාපටිපාටි, විශ්‍රාම සහ විශ්‍රාම ප්‍රතිලාභ, කම්කරු සබඳතා සහ කාර්මික සාමය පිණිස වෘත්තීය සමිති, මූල්‍ය සේවා කර්මාන්තයට අදාළව ඒවා හි පිරිවැය සහ ප්‍රතිලාභ, මූලික කම්කරු

ආරක්ෂණ නීති, ඒවායේ යහපත් ජාත්‍යන්තර පරිචයන්, රැකියා සුරක්ෂිත බව සහ ඵලදායිත්වය, සේවාවන් බාහිර ආයතන මගින් සම්පාදනය කිරීම

(v) ගනුදෙනුකරුවන් සුරක්ෂිත කරලීමේ නීති සහ පරිචයන් : විශ්වසනීය වගකීම්, මූල්‍ය නිපැයුම් වල අවදානම් පිළිබඳ අවබෝධය, නිපැයුම් වැරදි ලෙස අලෙවි කිරීම වැළැක්වීම, ගනුදෙනුකරුවන්ගේ තොරතුරුවල රහස්‍යභාවය, සාධාරණ වෙළෙඳපොල පරිචයන්, කතිපයාධිකාරී වෙළෙඳපොළ ව්‍යුහයට එරෙහිව තරගකාරිත්වය හෝ ඒකාබද්ධවීම්, පාරිභෝගික සුරක්ෂිතභාවය පිළිබඳ රීති සහ යෝජනා ක්‍රම (බැංකු සඳහා ගනුදෙනුකාර ප්‍රඥප්ති, රාජ්‍ය සුරකුම්පත් හසුරුවන ප්‍රාථමික වෙළඳුන්, තැන්පතු රක්ෂණ, හානිපූරණ අරමුදල්, පාරිභෝගික ආරක්ෂක පනතේ මූලික ප්‍රතිපාදනයන්, මූල්‍ය/රක්ෂණ/ඔම්බුඩ්ස්මන් යෝජනා ක්‍රමය, නීතිමය ක්‍රියාපටිපාටි)

## 8. ව්‍යාපාර ගණිතය සහ සංඛ්‍යානය (වෛකල්පික)

### I. විෂය හැඳින්වීම සහ අරමුණු

ගණිතය සහ සංඛ්‍යානය භාවිත කරමින් කරනු ලබන සංඛ්‍යාත්මක ගණනය කිරීම් බැංකු සහ මූල්‍ය ගනුදෙනු සඳහා විශාල ලෙස භාවිත වේ. විශේෂයෙන්ම ගණිතය සහ සංඛ්‍යානය, නිපැයුම් මිල කිරීම සහ අරමුදල් වෙළෙඳාම සඳහා භාවිත කෙරේ. බැංකුවල ප්‍රාග්ධනය සම්බන්ධව නව ගිණුම්කරණ ප්‍රමිතීන් අනුව නියාමනයන්ට අනුව තීරණ ගැනීමේදීත්, ව්‍යාපාරික ක්‍රමෝපායයන් තීරණය කිරීමේ දී සහ අවදානම් ඇගයීමේදීත් අවදානම් ආකෘති විශ්ලේෂණයන් බෙහෙවින් අවශ්‍ය වේ. තව ද, බැංකු සහ මූල්‍යායතන විසින් මූල්‍ය වෙළෙඳපොළ සහ ආයෝජනයන් පිළිබඳ සංඛ්‍යාත්මක ක්‍රමවේදයන් අඩංගු පර්යේෂණ කාර්යන් හි වැඩි කැපවීමකින් යුතුව නිරත විය යුතුය. කෙසේ වුවත්, ව්‍යාපාර ගණිතය සහ සංඛ්‍යානය අතිශයින් තාක්ෂණික සහ සංකීර්ණ විෂය ක්ෂේත්‍රයක් බැවින් මූල්‍ය කටයුතු පිළිබඳ මනා පරිචයක් ඇති ගණිතඥයන්ට පමණක් ප්‍රගුණ කළ හැකි ක්ෂේත්‍රයක්ද වේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස, ඉහළ වැටුප් හිමි බැංකු සහ මූල්‍ය අංශ වෘත්තීන් ගණිත විශේෂඥයින් විසින් හිමි කරගෙන ඇති අතර "මූල්‍ය ඉංජිනේරු විද්‍යාව" නමැති විෂයයක් ද බිහි වී ඇත. එම නිසා, මූල්‍ය ගනුදෙනුවල දී ගණිතය සහ සංඛ්‍යානය

පිළිබඳ මූලික මූලධර්ම පිළිබඳ ව දැනුමක් ලබා දීමේ සහ බැංකු සහ මූල්‍ය වෘත්තිකයන් ට ගණිතය සහ සංඛ්‍යානය සිය ව්‍යාපාරික කටයුතුවල දී භාවිත කිරීම සම්බන්ධ සාමාන්‍ය හුරුවක් ලබාදීමේ අරමුණු පෙරදැරිව මෙම විෂය සැලසුම්කොට ඇත.

## II . නිර්දේශිත විෂය අන්තර්ගතය

(i) දත්ත රැස් කිරීමේ ක්‍රමවේදයන් හඳුන්වාදීම : දත්ත සහ තොරතුරු, දත්ත වර්ග, දත්ත මූලාශ්‍ර, සංගහණය සහ නියැදි, නියැදි ක්‍රම

(ii) දත්ත නිරූපනය, සංඛ්‍යාත වගු, රූප සටහන්

(iii) සංඛ්‍යාත්මක සහ විස්තරාත්මක මිනුම් ක්‍රම, කේන්ද්‍රික ප්‍රවණතාවන් සහ අපගමනයන්

(iv) මූලික සම්භාවිතාව : සම්භාවිතාව හැඳින්වීම, ප්‍රමත ව්‍යාප්තිය

(v) සාමාන්‍ය ව්‍යාප්තිය භාවිත කරන විශ්වසනීය විරාම ඇස්තමේන්තු

(vi) කල්පිත පරීක්ෂණයන් හි මූලික කරුණුඃ කල්පිත පරීක්ෂණ හැඳින්වීම, සිග්මා දන්නා විට කල්පිත පරීක්ෂාව

(vii) රේඛීය සමීකරණ විශ්ලේෂණය සහ පුරෝකථන කිරීමඃ සරල රේඛීය සමීකරණ ආකෘතීන්, බහුවිධ/ වර්ග සමීකරණ ආකෘති, කාල ශ්‍රේණි විශ්ලේෂණය සහ සම්බන්ධිත විග්‍රහ කිරීම් සහ මිණුම්

(viii) ආකෘතිකරණය හැඳින්වීම

(ix) දර්ශක අංක ගොඩනැගීම : ප්‍රමාණාත්මක දර්ශක අංක, මිල දර්ශක අංක, දර්ශක අංක භාවිතය සහ ඒ හා සම්බන්ධිත ගැටළු

(x) තෝරා ගත් මූල්‍ය භාවිතයන් : බැඳුම්කර මිලකරණය, ඵලදායිතා වක්‍රයක් නිර්මාණය කිරීම/ඇස්තමේන්තු කිරීම, වර්තමාන වටිනාකම ගණනය කිරීම, ආයෝජන කළඹේ අපේක්ෂිත ඵලදා අනුපාතය, බාසල් 111 ණය අවදානම් ආකෘතිය, විකල්ප මිලකරණය

(xi) විශ්ලේෂණාත්මක වාර්තා පිළියෙළ කිරීම: බැංකු සහ මූල්‍ය සේවාවන්ට අදාළ මාතෘකා යටතේ සංඛ්‍යාන ක්‍රමවේදයන් භාවිත කරමින් ගැටළු අධ්‍යයනයන් කිහිපයක් සිදු කිරීම

# ව්‍යවහාරික බැංකු සහ මූල්‍ය ඩිප්ලෝමා පාඨමාලාව

ව්‍යවහාරික බැංකු සහ මූල්‍ය අන්තර් පාඨමාලාවෙන් ලබා දෙන ලද මූලික විෂය දැනුම වඩාත් සවිස්තරාත්මකව ප්‍රගුණ කිරීම උදෙසා බැංකු සහ මූල්‍ය අංශයේ විශේෂිත දැනුම ලබා දීම මෙම පාඨමාලාවෙන් අපේක්ෂා කෙරේ. මෙම පාඨමාලාවෙන් ලබා ගන්නා දැනුම සිසුනට සහ වෘත්තිකයන් හට සිය උපාධි සහ පශ්චාත් උපාධි පාඨමාලා කරා යෑමට මෙන්ම, සිය වෘත්තීය කටයුතුවල දී උසස්වීම් ලබා ගැනීම සඳහා, අවශ්‍ය වන ක්ෂේත්‍රයන්ගේ කාර්යසාධනය ඉහල නංවා ගැනීමට ද උපකාරී වනු ඇත. එම විශේෂිත ක්ෂේත්‍රයන් වනුයේ මුදල් සහ මූල්‍ය ප්‍රතිපත්තිය, ජාත්‍යන්තර වෙළෙඳාම සහ මූල්‍ය, මූල්‍ය ආයතන කළමනාකරණය, ණය කළමනාකරණය, මූල්‍ය කළමනාකරණය, මූල්‍ය වෙළෙඳපොළ කටයුතු, ආයෝජන බැංකු කටයුතු, මහ බැංකු කටයුතු සහ සංවර්ධන මූල්‍ය වේ. බැංකු සහ මූල්‍ය අංශයේ ඕනෑම රැකියා ක්ෂේත්‍රයකට පහසුවෙන් ප්‍රවිෂ්ඨ වීම සඳහා ද ඒවාට අනුගත වීම සඳහා ද, නව ඩිප්ලෝමා පාඨමාලාව (DABF) සම්පූර්ණ කිරීම සුදුසුකමක් වේ. මෙම පාඨමාලාව අනිවාර්ය විෂයන් 4 කින් සහ වෛකල්පික විෂයයන් 5 කින් සමන්විත වන අතර එම විෂයයන් 5 න් 3 ක් සමත් විය යුතුය. පාඨමාලාවේ එක් එක් විෂයන්හි හැඳින්වීම, අරමුණු සහ විෂය අන්තර්ගතය පහත දැක්වේ.

## 1. මුදල් හා මූල්‍ය ප්‍රතිපත්ති ආර්ථික විද්‍යාව

### I. විෂය හැඳින්වීම සහ අරමුණු

මූල්‍ය ප්‍රතිපත්තිය යනු  පොදුවේ මහ බැංකුවේ මූල්‍ය අධිකාරීන් විසින් ආර්ථිකයට බලපෑම් කරනු පිණිස සමස්ත ඉල්ලුමට/වියදමට බලපෑම් ඇතිකිරීම සඳහා ගනු ලබන ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග වේ. මෙම ප්‍රතිපත්ති, අනුකූල වෙනස්කම්, පොලී අනුපාත, ණය, විනිමය අනුපාත, සුරැකුම් මිල සහ මුදල් වෙළෙඳපොල ද්‍රවශීලතාව ආදී මුදල් හා සම්බන්ධ සාධක කිහිපයක් මත රඳා පවතී. සාර්ව ආර්ථික සහ මූල්‍ය ස්ථායීතා අරමුණු ආදී වශයෙන් මූල්‍ය ප්‍රතිපත්තියේ විවිධ පැතිකඩ දැකිය හැකිය. මූල්‍ය ප්‍රතිපත්ති මඟින් පොලී අනුපාත, වෙළෙඳපොළ ද්‍රවශීලතාව සහ වෙනත් විචක්ෂණශීලී නියාමන අවශ්‍යතා හරහා බැංකු සහ මූල්‍ය වෙළෙඳපොළ වෙත බලපෑම් කෙරෙන අතරම ඒවාට මගපෙන්වීම් ද කරනු ලබයි. මීට හේතුව, මුදල් වැඩි කොටසක් මැවීම සහ සංසරණය සිදුවන්නේ  බැංකු සහ මූල්‍ය වෙළෙඳපොළ

ව්‍යාපාර කටයුතු තුළින් වීමය. මුදල් යනු බැංකු සහ මුදල් ව්‍යාපාරවල මූලික යෙදවුම් වේ. එම නිසා මූල්‍ය ප්‍රතිපත්තිය බැංකු සහ මුදල් ව්‍යාපාරවලට සෘජුවම බලපෑම් සිදු කරයි. එහි ප්‍රතිඵලයක් ලෙස, බැංකු සහ මූල්‍ය වෙළෙඳපොළ කලින් කල සිය ව්‍යාපාරික මෙහෙයුම් කටයුතු සැලසුම් කිරීමේ දී මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාදාමයන් වෙත නිරතුරුවම සංවේදී වීමට සිදු වේ. එම නිසා ආර්ථිකය තුළ මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය න්‍යායාත්මක දැනුම සහ පරිචයන් දියුණු කර ගැනීම තුළින් බැංකු සහ මූල්‍ය වෘත්තිකයන් හට සිය සේවාදායක ආයතන වෙත විශාල දායකත්වයක් සැපයිය හැකි වන ලෙස මෙම විෂය සැලසුම් කොට ඇත.

## II . නිර්දේශිත විෂය අන්තර්ගතය

(i) මුදලේ විකාශනය : භාණ්ඩ හුවමාරු (බාටර්) ක්‍රමය, ද්‍රව්‍ය මුදල්, රන් මිනුම්, බැංකු නෝට්ටු, අඟ්‍රා මුදල්, විද්‍යුත් මුදල්, අතථ්‍ය මුදල්

(ii) මුදලේ කාර්යයන් සහ බැංකු හා අනෙකුත් මූල්‍යායතනවල මුදල් හා සම්බන්ධ ව්‍යාපාරික කටයුතු : හුවමාරු මාධ්‍යයක් ලෙස, ගිණුම් ඒකකයක් ලෙස, වටිනාකමේ ද්‍රවශීලතා සන්නිධියක් ලෙස හා කල් පසු වූ ගෙවීම් මාධ්‍යයක් ලෙස මුදලේ කාර්යයන් සහ මෙම කටයුතු පහසු කිරීම සඳහා මූල්‍ය සේවා සැපයීම

(iii) මුදලේ ආර්ථික ක්‍රියා කලාපය : සම්පත් හුවමාරුව (ඉතිරිකරන්නාගෙන් ආයෝජකයාට) මූල්‍යකරණය සහ උත්තෝලනය, මිල යන්ත්‍රණය, වෙළෙඳපොළ සහ ආර්ථික කාර්යක්ෂමතාව

(iv) මුදල් සැපයුම ගණනය කිරීම : $M_1$ , $M_2$, $M_{2b}$ සහ $M_4$ සහ ඒ හා සම්බන්ධ කරුණු

(v) මුදල් සඳහා ඇති ඉල්ලුම : ගනුදෙනු, ආරක්ෂණ සහ සමපේක්ෂණ චේතනාව, ඉල්ලුම සඳහා බලපාන සාධක, තුලිතතාව සඳහා වන ඉල්ලුම, ද්‍රවශීලතා වරණය සහ ද්‍රවශීලතා ප්‍රයෝග (උගුල)

(vi) මුදල් මැවීම : පදනම් මුදල්, තැන්පතු සහ ණය, මුදල්/ණය ගුණකය පිළිබඳ විශ්ලේෂණය, මූල්‍ය සමීක්ෂණය, මුදල් සැපයුම තීරණය වන සාධක

(vii) පොළී අනුපාත තීරණය කිරීම : පොළී අනුපාතයේ ක්‍රියා කලාපය, ණය අරමුදල් න්‍යාය, ද්‍රවශීලතා වරණ න්‍යාය, පොළී අනුපාත අවදානම් සහ කාල ව්‍යුහය, වෙළෙඳපොළ පොළී අනුපාත මත ප්‍රතිපත්තිමය අනුපාත වල බලපෑම, වෙළෙඳ පොල පොළී අනුපාත සහ පාදක අනුපාත

(viii) මුදල් ප්‍රමාණවාදී න්‍යාය සහ ආර්ථිකය මත මුදලේ බලපෑම

(ix) මූල්‍ය ප්‍රතිපත්ති සහ ක්‍රියාත්මක කිරීම : අරමුණු (කේවල, ද්විත්ව සහ බහුවිධ), මිල/ආර්ථික ස්ථායිතාව සහ සාර්ව-විචක්ෂණශීලී විශ්ලේෂණය, මූල්‍ය උපකරණ, සම්ප්‍රේෂණ යන්ත්‍රණය, වෙළෙඳපොල ද්‍රවශීලතා කළමනාකරණය, ඉලක්ක (මුදල්, උද්ධමනය, නාමික දළ දේශීය නිෂ්පාදිතය ආදිය) ඉදිරි මඟ පෙන්වීම වෙත පිවිසීම, සම්ප්‍රදායික සහ සාම්ප්‍රදායික නොවන ප්‍රතිපත්ති, සන්නිවේදන උපායමාර්ග සහ උද්ධමන අපේක්ෂා, මුදල් ප්‍රතිපත්ති සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති අතර සම්බන්ධීකරණය

(x) මුදල් ප්‍රතිපත්තියේ බලපෑම : නාමික සහ මූර්ත බලපෑම්, වත්කම් මිල බුබුළු සහ බැංකු, සහ මූල්‍ය ක්ෂේත්‍රය කෙරෙහි එහි බලපෑම.

(xi) ශ්‍රී ලංකාවේ මුදල් ප්‍රතිපත්තියේ මෑත කාලීන ප්‍රවණතා : මුදල් නීති පනතේ අදාළ විධිවිධාන, පසුගිය දශක දෙක තුළ මුදල් ප්‍රතිපත්තියේ වක්‍රීය හැසිරීම, උපකරණ සහ අරමුණු

(xii) එක්සත් රාජධානිය, ඇමෙරිකා එක්සත් ජනපදය, යුරෝපා කොමිසම සහ ජපානය යන රටවල මෑත කාලීන ගෝලීය මුදල් ප්‍රතිපත්ති ප්‍රවණතා : පසුගිය දශක දෙක තුළ මූල්‍ය ප්‍රතිපත්තියේ චක්‍රීය හැසිරීම, පොළී අනුපාත සකස් කිරීමේ යන්ත්‍රණය, රජය මඟින් බැඳුම්කර මිලදී ගැනීම තුළින් මුදල් සැපයුම වැඩි කීරීමේ (ප්‍රමාණාත්මක ලිහිල් කිරීම්) ප්‍රතිපත්ති සහ සාම්ප්‍රදායික නොවන මූල්‍ය ප්‍රතිපත්ති හා ඊට බලපාන සාධක, මූල්‍ය ප්‍රතිපත්තිය මත වර්තමාන වෙළෙඳපොළ අපේක්ෂා

## 2. මූල්‍ය කළමනාකරණය

### I. විෂය හැඳින්වීම සහ අරමුණු

ආයතනයක් විසින් සිය අරමුදල් සහ මුදල් ප්‍රවාහයන් ලාභදායී, ආරක්ෂාකාරී සහ ඉතා යහපත් ආකාරයට කළමනාකරණය කරනුයේ කවර අන්දමකට ද යන්න මූලික වශයෙන් මූල්‍ය කළමනාකරණය ලෙස හැඳින්වේ. දෙන ලද ඉලක්ක සහ ඉපයුම්/ප්‍රතිලාභවලට අනුව සමස්ත අවදානම් කළමනාකරණය එයට අයත් ය. සාමාන්‍යයෙන් ඒකාබද්ධ අරමුදල් කළමනාකරණය හෙවත් භාණ්ඩාගාර අරමුදල් කළමනාකරණය මෙම විෂය යටතට ඇතුළත් වේ. වත්මන් මූල්‍ය ලෝකය තුළ මූල්‍ය නිර්මාණකරණයට මූල්‍ය කළමනාකරණ ක්ෂේත්‍රය සම්බන්ධ වැදගත් තැනක් හිමිව තිබේ. අරමුදල් රැස් කිරීමේ උපකරණ, ප්‍රාග්ධන සහ ද්‍රවශීල කළමනාකරණය, ආයෝජන, මූල්‍ය සැලසුම්කරණය සහ පුරෝකථනය සහ මූල්‍ය වංචනික ක්‍රියා වළක්වා ගැනීම සඳහා අලෙවි කටයුතු පාලනය කිරීම මෙම විෂයයේ ප්‍රධාන ක්ෂේත්‍රයන් වේ. බැංකු සහ මූල්‍ය ආයතනයන් හි අසාර්ථකවීම් සහ විවිධ ආයතනයන්හි වංචනික ක්‍රියා පිළිබඳ වාර්තාවන්ට අනුව මූල්‍යකරණයන් විචක්ෂණශීලී ලෙස කළමනාකරණය නොකළහොත් ඕනෑම ව්‍යාපාරයක් එක් රැයකින් කඩා වැටීමට ඉඩකඩ ඇත. බැංකු සහ මූල්‍ය ආයතනයන් හි වෘත්තිකයන්ට සිය ආයතනයන් කළමනාකරණය කිරීමේ දී මෙන්ම ඔවුන්ගේ ආයතනයන්ට සහ වැදගත් ගනුදෙනුකරුවන්ට මූල්‍ය කළමනාකරණ සේවා සම්පාදනයේ දී මෙම විෂය පිළිබඳ දැනුම අවශ්‍ය වේ. මූල්‍ය කළමනාකරණ විෂයට පුළුල් වශයෙන් න්‍යායාත්මක, වීජ ගණිතමය, සංඛ්‍යාත්මක සහ විශ්ලේෂණාත්මක මාතෘකා අන්තර්ගත වේ.

කෙසේ වුවත්, බැංකු සහ මූල්‍ය අංශයේ වෘත්තිකයන්ට මූල්‍ය කළමනාකරණය පිළිබඳ මූලික දැනුම ලබා දීම පිණිස සහ විෂය පිළිබඳ තව දුරටත් ප්‍රායෝගික දැනුම සහ විශේෂඥතාව ලබා ගත හැකිවනු පිණිස විෂය සැලසුම් කොට ඇත.

## II . නිර්දේශිත විෂය අන්තර්ගතය

(i) අරමුදල් වැඩි කර ගැනීමේ උපකරණයන් සහ පිරිවැය : කොටස්, වෙනස්වීම් සහ බලපත්‍ර, ණය උපකරණ, සුරැකුම්කරණය/වත්කම් වලින් ආවරණය වන සුරැකුම්පත්‍ර, තෝලන ගැනුම් සහ ඒවායේ ක්‍රියාපටිපාටි සහ පිරිවැය

(ii) වත්කම් - වගකීම් කළමනාකරණය : ද්‍රවශීලතා අවදානම, පරිණති පරතර විශ්ලේෂණය, මුදල් ප්‍රවාහ කළමනාකරණය, ද්‍රවශීල වත්කම් සහ ද්‍රවශීලතා අනුපාත, ද්‍රවශීලතා වැඩිකර ගැනීම (වත්කම් කළමනාකරණය සහ වගකීම් කළමනාකරණය) වත්කම් - වගකීම් කමිටු (ALCO) යන්ත්‍රණය, කාරක ප්‍රාග්ධන කළමනාකරණය (working capital management), ප්‍රාග්ධන ඇස්තමේන්තු (capital budgeting )

(iii) භාණ්ඩාගාර සහ ආයෝජන කළඹ කළමනාකරණය : අරමුදල් වර්ග (ඉදිරි රැකුම් අරමුදල්, විශ්‍රාම අරමුදල්, අර්ථසාධක අරමුදල්, අතිරික්ත අරමුදල් ආදිය) ආයෝජන කළඹ/ වත්කම් මිශ්‍රව තෝරා ගැනීමේ ක්‍රමෝපායයන්, ගෝලීය සහ දේශීය වෙළෙඳපොළ ආයෝජන නිපැයුම්, වත්කම් ගිණුම්කරණය (ලාභාලාභයන් හි සාධාරණ වටිනාකම්, පරිණත වන තෙක් රඳවා ගැනීම, අලෙවිය සඳහා වීම ආදිය සහ හානිකරණ ප්‍රමිතීන්), අවදානම මිනුම්කරණය සහ කළමනාකරණය (අවදානම් අගය, පරිනතවීම් පරතර, පොළී අනුපාත පරතර, විකර්ණ පවත්නා කාලය, ආතති විශ්ලේෂණය, ව්‍යුත්පන්නයන්ගේ භාවිතයන්, විවෘත තත්ත්ව සීමා), අරමුදල් කළමණාකරණය සහ මෙහෙයුම් ව්‍යුහය, (ඉදිරි පෙළ, මධ්‍ය සහ පසු පෙළ ලෙස කාර්යාල කාර්ය වෙන් කර ගැනීම) ආයෝජන කළඹ මත ඉපයුම් (ප්‍රාග්ධන ඉපයුම්, ලාභාංශ/පොළී, වෙළෙඳපොළට ලකුණු කිරීම/සාධාරණ වටිනාකම් ප්‍රතිලාභ ආදිය, ඉපයුම් මිනුම් ප්‍රමිතිකරණය)

(iv) මූල්‍ය විශ්ලේෂණය, සැලසුම්කරණය සහ පුරෝකථනය : අවදානම්/ඉපයුම් හුවමාරු කර ගැනීම, අයවැයකරණ ශිල්ප ක්‍රමයන් (ව්‍යාපාර මාර්ග පදනම් කරගෙන, ක්‍රියා අනුව, ව්‍යාපාර/මෙහෙයුම් ඉලක්ක ආදිය අනුව) අනාගත මූල්‍ය ප්‍රවාහ පුරෝකතනය, මුදලේ කාල වටිනාකම් /වත්මන් අගය සහ උචිත මූල්‍ය තෝලන මට්ටම, මූල්‍ය කාර්යසාධන පුරෝකථනයන් (අතීත කාර්යසාධනයන්ගේ සංඛ්‍යාත්මක ආකෘතීන් සහ අනෙකුත් ආකෘතීන් හෝ විස්තරාත්මක විනිශ්චයන් පදනම් කරගත් පුරෝකථනයන්, ආතති සෙනාරියෝ පරීක්ෂණ, ආදිය)

## 3. ජාත්‍යන්තර වෙළෙඳාම සහ මූල්‍ය

### I. විෂය හැඳින්වීම සහ අරමුණු

ජාත්‍යන්තර වෙළෙඳ ව්‍යාපාරික කටයුතුවල යෙදෙන සිය ගනුදෙනුකරුවන්ට සේවා සම්පාදනය කරන බැංකුවලට එය විශේෂ බැංකු සේවාවක් වේ. ජාත්‍යන්තර වෙළෙඳාම ඕනෑම විවෘත ආර්ථිකයක මූලික ආර්ථික කටයුත්තකි. සාම්ප්‍රදායිකව, ජාත්‍යන්තර වෙළෙඳාම් කටයුතු සඳහා බැංකු විසින් අපනයන හා ආනයනකරුවන් අතර ගෙවීම් සහ පියවුම් නියෝජිතයෙකු ලෙස වෙළෙඳ පියවුම් සඳහා අවශ්‍ය අරමුදල් සහ පහසුකම් සම්පාදනය කරනු ලබයි. අන්තර්ජාතික වෙළෙඳාමේ දී විවිධ ව්‍යවහාර මුදල්වලින් කෙරෙන ලැබීම් සහ ගෙවීම් සම්බන්ධ වන බැවින් බැංකු මඟින් විදේශීය විනිමය සේවාවන් ද සැපයීම අවශ්‍ය වේ. ඒ අනුව, අන්තර්ජාතික වෙළෙඳ ගනුදෙනුකරුවන්ට බැංකු විසින් විවිධ මූල්‍ය සේවාවන් සම්පාදනය කරනු ලබයි. ජාත්‍යන්තර වෙළෙඳ කටයුතු විධිමත් ක්‍රියා පටිපාටීන්ටත්, දේශීය හා ගෝලීය ආර්ථික ප්‍රතිපත්තීන්ටත් යටත් වේ. එම නිසා වෙළෙඳ මූල්‍යකරණ සේවා සහ වෙළෙඳ කටයුතු සම්බන්ධ දේශීය හා ගෝලීය ක්‍රියා පටිපාටීන් සහ පද්ධතීන් පිළිබඳව බැංකු සහ මූල්‍ය අංශයේ වෘත්තිකයන්ට වෙළෙඳ සේවා වෘත්තීය කටයුතු සහ කාර්යසාධනයන්වල නිරතවීමේ දී අවශ්‍ය කරන පරිපූර්ණ තාක්ෂණික දැනුම සම්පාදනය කරනු පිණිස මෙම විෂය සැලසුම්කොට ඇත.

## II . නිර්දේශිත විෂය අන්තර්ගතය

(i) ජාත්‍යන්තර වෙළදාම හා මූල්‍යකරණය පිළිබඳව මූලික ආර්ථික විද්‍යාව : ගෙවුම් ශේෂයේ ව්‍යූහය සහ ගෙවුම් ශේෂය මූල්‍යකරණ විකල්පයන් (මහ බැංකු සංචිත, විදේශීය ප්‍රාග්ධනය) විනිමය අනුපාත යාන්ත්‍රණය, ව්‍යවහාර මුදලේ පරිවර්ත්‍යතාව සහ විනිමය පාලනයන් (ප්‍රාග්ධන), වෙළෙඳ ප්‍රතිපත්තීන්, (තීරු බදු සහිත සහ රහිත ප්‍රතිපත්තීන්, අපනයන ප්‍රවර්ධනය සහ ආනයන ආදේශනය) ආර්ථික වර්ධනය සඳහා ජාත්‍යන්තර වෙළෙඳාමේ වැදගත්කම, ආදායම, සේවා නියුක්තිය සහ ගෝලීයකරණයේ යහපත් ප්‍රතිඵල සඳහා ප්‍රවේශ වීම

(ii) වාණිජ ලේඛන : විනිමය බිල්පත්, නෞභාර පත්‍රය, නාම මාත්‍ර ඉන්වොයිසි, වාණිජ ඉන්වොයිසි, පරීක්ෂණ සහතිකය, ප්‍රභවස්ථාන සහතිකය, නැව් කුලී රක්ෂණය, ප්‍රතිලාභියා විසින් නිකුත් කළ සහතිකය

(iii) වෙළෙඳ ගෙවීම් ක්‍රමවේද සහ පද්ධතිः ලේඛන රැස්කිරීම (Documentary Collection) /(DP සහ DA), සහ ණයවර ලේඛන (Documentary Credit), විවෘත ගිණුම් (Open Account), නියෝජන ගිණුම්, අත්තිකාරම් ගෙවීම් (Advaned Payment), SWIFT නියෝජිත බැංකු සහ නොස්ට්‍රෝ/වොස්ට්‍රෝ ගිණුම් (Nostro & Vostro)

(iv) ජාත්‍යන්තර වාණිජ මණ්ඩලය, (ICC) රෙගුලාසි (නවතම සංස්කරණය) : ණයවර ලිපි සඳහා එක හා සමාන ක්‍රමවේද සහ පරිචයන් (UCP), ලේඛන රැස් කිරීම් සඳහා ඒකාකාරී රීති (URC), දේශීය හා ජාත්‍යන්තර වෙළඳාමේ දී භාවිත කරන වෙළෙඳ කොන්දේසි (ඉන්කොටර්ම්ස්) ලේඛන ණයවර යටතේ බැංකු අතර ප්‍රතිපූර්ණයන් සඳහා රීති (URR), ඉල්ලුම් ඇපකර සඳහා ඒකාකාරී රීතින් (URDG)

(v) රේගු කාර්ය පටිපාටි : භාණ්ඩ වර්ගීකරණය සහ අනුකූලත්ව ක්‍රම, අවශ්‍ය ලියවිලි, ආනයන භාණ්ඩ නිශ්කාශනය, බදු /තීරු බදු ගණනය සහ ගෙවීම්, රේගු ගබඩා බන්ධිත වෙළෙඳාම්, අන්තරාල වෙළඳාම (Entrepot Trade) සහ ප්‍රමාදවීම් සඳහා පහසුකම්

(vi) වෙළෙඳ මූල්‍යකරණය : බිල්පත් වට්ටම් කිරීම, බිල්පත් මිලයට ගැනීම, ලැබිය යුතු මුදල් සඳහා මූල්‍යකරණය, පූර්ව නැව්ගත කිරීමේ ණය, (ඇහුරුම් ණය) පශ්චාත් නැව්ගත කිරීමේ ණය, ඔඩපන (Pledge) භාර කුවිතාන්සි ණය, ප්‍රතිග්‍රහණයන්, ගැනුම්කරුවන්ගේ ණය, කාරක ප්‍රාග්ධන ණය, අපනයන ණය රක්‍ෂණය, ජාත්‍යන්තර ඇපකර (අත්තිකාරම් ගෙවීමේ ඇපකාර, ලංසු බැඳුම්කර, කාර්යසාධන බැඳුම්කර, මූල්‍ය ඇපකර, ණයවර ලිපි, උපස්ථ, පසුපස, පැවරිය හැකි, චක්‍රීය ආදිය, ෆෝෆේටින් සහ ඇවලයිසේෂන් (Forfaiting & Avalization)

(vii) විදේශීය ව්‍යවහාර මුදල් සේවා : එතැන් ගැණුම් සහ විකුණුම්, ඉදිරි ගැණුම් සහ විකුණුම්, ඉදිරි විනිමය අනුපාත තීරණය වීම, රැස් කිරීම් සහ ගෙවීම් බැංකු සේවා, විදේශීය ව්‍යවහාර මුදල් ගිණුම් (RFC ,NRFC, SIA, FCCA නොස්ට්‍රෝ ආදිය)

(viii) ශ්‍රී ලංකාවේ අපනයන හා ආනයන කටයුතු වලට සම්බන්ධ නීතිරීති හා බදු/තීරු බදු : විනිමය පාලනයන් අනුව පොදුවේ අනුමැතිය ලැබෙන විනිමය පාලන ගෙවීම් සහ ලැබීම්, ප්‍රතිඅපනයනයේ දී කෙරෙන නිදහස් කිරීම්, අපනයන කටයුතු සඳහා, අපනයනයන් සහ ආනයනයන් සඳහා බදු අනුපාත සෙස් සහ තීරු ගාස්තු සහ ඒවායේ අරමුණු, ආනයනයන් සඳහා අත්තිකාරම් ගෙවීම්, ඉදිරි ගිවිසුම්, ආනයන හා අපනයන (පාලන) පනතේ ප්‍රතිපාදන සහ විශේෂ ආනයන බලපත්‍ර සහ ගෙවීම් රීති

(ix) ජාත්‍යන්තර වෙළෙඳ විධි විධාන සහ ප්‍රමිතීන් : ජාත්‍යන්තර සංවිධාන සහ පද්ධතීන්, ලෝක වෙළෙඳ සංවිධානයේ (ගැට් GATT) සංවිධානයේ ප්‍රභවය, විකාශනය සහ උරුගුවේ වෙළෙඳ සාකච්ඡා වටයේ පරමාර්ථ, ප්‍රපාතනය සහ සහනාධාර පිළිබඳව ලෝක වෙළෙඳ සංවිධානයේ (WTO) ගිවිසුම්, ආනයන බලපත්‍ර, පූර්ව නැව් ගත කිරීම් පරීක්ෂණ, වෙළෙඳ බාධක, වෙළෙඳ ආරවුල් බේරුම් කිරීම, ප්‍රභවස්ථාන රීති, වරණීය/නිදහස් වෙළෙඳාම ආදිය, අන්තර් ජාතික මූල්‍ය අරමුදල (ප්‍රභවය, බ්‍රෙට්න්වුඩ් ක්‍රමය, විකාශය, අරමුණු, විශේෂ හැර ගැනීමේ අයිතීන් (SDR), ස්ථාපිත ගිවිසුම් සහ විස්තීරණ අරමුදල් පහසුකම්) නිදහස් වෙළෙඳ කලාප, බහුපාර්ශවීය සහ ද්වි පාර්ශවීය වෙළෙඳ ගිවිසුම්, රේගු සහයෝගිතා ආර්ථික සහයෝගිතා, (උදාහරණ - යුරෝපීය සංගමය) වරණීය සාධාරණීය ක්‍රමයන්, යුරෝපීය සංගමයේ වෙළඳ වරණයන් පිළිබඳව වූ පොදු ක්‍රමය G S P + සහ එක්සත් ජනපද G S P

## 4. ණය කළමනාකරණය

### I. විෂය හැඳින්වීම සහ අරමුණු

ණය මුදල් ප්‍රදානය බැංකු සහ මූල්‍ය අතරමැදිකරණ ආයතනවල මූලික ව්‍යාපාරික කටයුත්තක් වන අතර කෙතරම් කාර්යක්ෂම ලෙස ණය කටයුතු කළමනාකරණය කරන්නේ ද යන්න මත ඒවායේ කාර්ය සාධනය සහ ව්‍යාපාරික තිරසාරත්වය බොහෝ දුරට රඳා පවතියි. ණය කළමනාකරණය සහ ණය ප්‍රදානය සඳහා තීරණ ගැනීමේ සිට, ණය ප්‍රදානය සහ අය කිරීම, ණය/ණය අවදානම් කළමනාකරණය, ණය පාලනය, සහ බැංකුකරු - ණයකරු අතර සබඳතා ගොඩනැංවීම තෙක් මෙහි අන්තර්ගත වේ. එම නිසා, බැංකු සහ මූල්‍යායතනවල ණය ව්‍යාපාරික කටයුතුවල තීරණ ගැනීමේ සහ මෙහෙයුම් මට්ටම්වල විශාල සේවක පිරිසක් සේවයේ නියුක්තව සිටියි. ණය කළමානකරණ ක්‍රමවේදයන් සහ පරිචයන් තුළින් විශාල ලෙස ණය ව්‍යාපාරික දැනුමක් විකාශනය වී ඇත. එම නිසා, එය තාක්ෂණික සහ ප්‍රායෝගික යන දෙඅංශයේම දැනුමෙන් සමන්විත විශේෂිත වෘත්තිමය විෂයයක්

වේ. ඒ අනුව, බැංකු සහ මූල්‍ය අංශයේ වෘත්තිකයින් සඳහා ණය කළමනාකරණය පිළිබඳව පරිපූර්ණ දැනුමක් ලබා දෙනු පිණිස මෙම විෂයය සැලසුම්කොට ඇත.

## II . නිර්දේශිත විෂය අන්තර්ගතය

(i) ණය නිපැයුම් හැඳින්වීම : නිර්වචනයන් සහ බැංකු/මූල්‍ය ආයතනයන්හි ව්‍යාපාරික සහ ආර්ථිකය තුල ණය ප්‍රදානයේ භූමිකාවන්, ණය නිපැයුම්වල මෙහෙයුම් කටයුතු (ගනුදෙනුකරුවන්ගේ ස්වභාවය, ලක්ෂණ, සුරැකුම්, මූලික කොන්දේසි සහ නියමයන් ආදිය) අරමුදල් පදනම් කර ගත් ණය පහසුකම් (අයිරා, උකස්කරය, බන්ධන, රන් භාණ්ඩ උකස් ගැනීම, කල්බදු, කාරක ප්‍රාග්ධන ණය, බිල්පත් වට්ටම් කිරීම, බිල්පත් මිලට ගැනීම, ඇසුරුම් ණය, භාර කුවිතාන්සි ණය, ණය කාඩ්පත් පහසුකම්, ප්‍රතිමූල්‍ය ණය ආදිය) සහ ගාස්තු පාදක පහසුකම් (ණයවර ලිපි, ඇපකර, ප්‍රතිග්‍රහණ ආදිය)

(ii) ණය යෝජනා ඇගයීම් ක්‍රියාවලි : ණය ඇගයීමේ දී සලකා බැලිය යුතු මූලික කරුණු, C 6 (චරිතය, හැකියාව, ප්‍රාග්ධනය, කොන්දේසි, සුරැකුම්, මුදල් ප්‍රවාහය) මුදල් උත්පාදන ආකාරය, (ද්‍රවශීලතා අවදානම, සමච්ඡේදන ලක්ෂ්‍ය විශ්ලේෂණය), ආයතනික ණය ඇගයීම (කළමනාකරණ, වාණිජ, මූල්‍ය, ආර්ථික ශක්‍යතා අධ්‍යයන) ණය ශ්‍රේණිගත කිරීම්, (අභ්‍යන්තර ශ්‍රේණි ආකෘති සහ බාහිර ශ්‍රේණිගත තත්වයන්) ණය මිලකරණය

(iii) ණය ප්‍රතිපත්ති සහ පාලනයන් : ණය ප්‍රතිපත්ති ලේඛනවල ආවරණයන් (ණය නිපැයුම්, ඉලක්කගත වෙළෙඳපොළ, සුරැකුම්, අනුමත කිරීම් සීමා - ණය කමිටු, විධායකයන්) ණය පරිපාලනය, ලේඛණය, කළමනාකරණ තොරතුරු සහ වාර්තාකරණය (MIS), ණය අවදානම් අවම කර ගැනීම සම්බන්ධව මහ බැංකුව පනවා ඇති නියෝග, ගිණුම්කරණ ප්‍රමිති අවශ්‍යතා (හානිකරණය) සහ අවශ්‍යතාවයන්

(iv) ණය අවදානම් මෙහෙයවීම /පසු විපරම් : කාලීනව ණයකරුගේ තොරතුරු/ ගිණුම් ප්‍රකාශන සොයා බැලීම/විපරම් කිරීම, පරීක්ෂණ (අභ්‍යන්තර/බාහිර නියෝජ්‍යායතන), ණය ප්‍රතිලේඛනය, අයකිරීම් ක්‍රියාමාර්ග, ණය ව්‍යුත්පන්නයන් භාවිතය (සුරැකුම්කරණය, ණය පැහැර හැරීම්, හුවමාරු ආදිය), බාසල් ණය අවදානම් ආකෘතීන් සහ ප්‍රාග්ධන වෙන් කිරීම්

## 5. මූල්‍ය ආයතන කළමනාකරණය (වෛකල්පික)

### I. විෂය හැඳින්වීම සහ අරමුණු

මූල්‍ය ආයතනවල මුදල් සම්බන්ධ විශේෂිත ව්‍යාපාරික කටයුතු සාර්ව ආර්ථිකයට සහ ජනතාවට පුළුල් බලපෑමක් ඇති කරනු ලබන හෙයින් මූල්‍යායතනයන්ට (ප්‍රධාන වශයෙන් මූල්‍ය අතරමැදි ආයතනයන්ට) අනෙකුත් ව්‍යාපාරික ඒකකයන්ගෙන් වෙනස් නිශ්චිත කළමනාකරණ ප්‍රවේශයක් අවශ්‍ය වේ. මූල්‍යායතන කළමනාකරණයේ මූලිකාංගය වනුයේ සිය ව්‍යාපාරික ගනුදෙනු සපුරා ගැනීමේ හැකියාව පිණිස ගනුදෙනුකාර විශ්වාසය ගොඩනගාගැනීම සහ ආරක්ෂා කර ගැනීමයි. එය මුදල්මය ගනුදෙනුවක් වන විට එක් පාර්ශවයකට එය වත්කමක් වන අතර අනෙක් පාර්ශවයට එය වගකීමක් වන හෙයින්, ගනුදෙනුකාර විශ්වාසය තහවුරු වීම ගනුදෙනුවල තිරසර බවට හේතු වනු ඇත. ගනුදෙනුකාර විශ්වාසය ආරක්ෂා කර ගැනීමට, සේවකයින්ගේ අවංක භාවය, ප්‍රතිපත්තීන් සහ පද්ධති තීරණාත්මක සාධක වේ. මේ සම්බන්ධව ආයතනයන්ගේ කළමනාකරණ මූලධර්ම, යහපත් පරිචයන් සහ නෛතික අවශ්‍යතා අනුගමනය කිරීම සහ අනුකූලත්වය දැක්වීම කළ යුතුය. කළමනාකාරිත්වයන් පිළිබඳව සේවකයින්ගේ සහ කළමනාකරුවන්ගේ දැනුමේ ඌනතාවයන් නිසා වංචා සහ වැරදි කළමනාකරණය හේතුවෙන් මූල්‍යායතන අසාර්ථක වීමට සහ බුන්වත් වීමට හේතු වනු ඇත. එම නිසා, බැංකු සහ මූල්‍ය අංශයේ වෘත්තිකයින්ට සිය මෙහෙයුම් කටයුතු පුළුල් රාමුවක් තුළ කරගෙන යාමට සහය වනු පිණිස, පුළුල් ක්ෂේත්‍රයක අවශ්‍ය කරන දැනුම සහ සංරචකයන් සලසා දීම සඳහා මෙම විෂය සැලසුම් කොට ඇත. කෙසේ වුවත්, විෂයය කේන්ද්‍රීය ක්ෂේත්‍රයන්ට පමණක් සීමා කිරීම පිණිස, මූල්‍යායතනයන්හි මූල්‍ය, මානව සම්පත් සහ අලෙවිකරණ, කළමනාකරණ ක්ෂේත්‍රයන් මෙම විෂයය

මගින් ආවරණය කිරීමෙන් වැළකී ඇත. එම අංශයන් මෙම වැඩසටහනේ මූල්‍ය ගනුදෙනුකරුවන් කළමනාකරණ විෂයය මගින් ආවරණය කර ඇත.

## II . නිර්දේශිත විෂය අන්තර්ගතය

(i) සංස්ථාපනය : සමාගම් පනත අනුව කාර්ය පටිපාටිය, විවිධ වර්ගවල සමාගම් ලියාපදිංචි කිරීම සහ අවශ්‍ය කරන ලිපි ලේඛන

(ii) මූල්‍ය ව්‍යාපාර ආයතන සඳහා බලපත්‍ර ලබා ගැනීම (වාණිජ බැංකු, විශේෂිත බැංකු, මුදල් සමාගම්, කල්බදු මූල්‍යකරණ සමාගම්, රක්‍ෂණ සමාගම්, අරමුදල් කළමනාකරණ සමාගම්, සමුපකාර, අලෙවිකරණ සහ තැරැව්කරණ සමාගම්, ගෙවීම් සේවා සම්පාදකයින් ආදිය)

(iii) කොටස්කරුවන් : සමාගම් පනතට අනුව ඔවුන්ගේ හිමිකම් සහ වගකීම්, අනෙකුත් නියාමන ප්‍රතිපාදනයන් සහ ආයතනික යහපාලන පරිචයන්

(iv) සමූහයන් සහ සංවිධාන ව්‍යුහයන් : ව්‍යාපාරික ක්‍ෂේත්‍රයන් හඳුනා ගැනීම, සඵලදායී ව්‍යාපාරික ප්‍රමාද දෝෂ, සහ Chinese Walls, සංවිධාන සටහන්, සමූහ සමාගම්

(v) පුළුල් කිරීමේ ක්‍රමෝපායයන් : සුපිරි මූල්‍ය වෙළෙඳසැල් සමූහයන් (බැංකු, රක්‍ෂණ සහ සුරැකුම්පත් වෙළෙඳාම), උප සමාගම් ස්ථාපනය, ඒකාබද්ධ වීම් සහ අත්පත් කර ගැනීම් (අරමුණු, පරිමාණය සහ විෂය පථය, හරස් විකිණුම්කරණය, වෙළෙඳපොළ භාගය සහ ක්‍රියා, බදුකරණය, සිරස් ඒකාබද්ධ වීම ආදිය, වෙළෙඳපොළ පරිචයන්, මිත්‍රශීලීව හෝ ප්‍රතිවිරුද්ධ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදනයන් සහ විචක්‍ෂණ අධ්‍යයනයන්, මූල්‍යකරණ ක්‍රම, ලීවරණ, කොටස් මිලට ගැනීම, හිමිකාරිත්ව, ජයග්‍රාහී/ අසාර්ථක සාධකයන්)

(vi) මූල්‍ය වාර්තාකරණය සහ විශ්ලේෂණය : මූල්‍ය තොරතුරු වාර්තාකරණයෙහි අභ්‍යන්තර පාලනයන්, මූල්‍ය වාර්තාවල ප්‍රධාන වශයෙන් හෙළි කළ යුතු දෑ,

මූල්‍ය කාර්යසාධන විශ්ලේෂණ (මූල්‍ය ගිණුම්කරණ අනුපාත විශ්ලේෂණය, සහ අවදානම් පදනම් කරගත් ව්‍යාපාර කාර්යසාධන වාර්තා සැකසීම)

(vii) විගණනය : බාහිර සහ අභ්‍යන්තර විගණන ක්‍රියාවලියන් (විගණන වර පත්‍රය, බලතල, කාර්යයන්, නියැදි, සන්නිවේදනය, ආදිය) විගණන ක්‍රම (අනුකූලතා පදනම් කරගත්, අවදානම් පදනම් කරගත්, කාර්යසාධන ඇගයීම් ආදිය) ප්‍රධාන විගණන ප්‍රමිතීන්, විගණන කමිටු, වාර්තාකරණය සහ ගැටළු විසඳීම/ විගණන මත

(viii) අනුකූලතා : අරමුණු (අවංකත්වය සහ අවදානම් කළමනාකරණ සංස්කෘතිය) අදාළ නීති සමග ඇති අනුකූලත්වය පිළිබඳ මෙහෙයුම් යන්ත්‍රණය, නියාමනය, ප්‍රතිපත්ති, ක්‍රියාවලීන්, සහ සේවකයින් විසින් කරනු ලබන අභ්‍යන්තර පාලනයන්, අනුකූලත්වය නොමැති වාර්තාකරණයන් සහ අදාල විනය කාර්යපටිපාටි, අනුකූලතා නිලධාරී, බැංකු සහ මූල්‍යායතනවල ලොව මෑතකදී වාර්තා වූ අනුකූලතා නොදැක්වීම සම්බන්ධ ගැටලු

(ix) ආයතනික යහපාලනය : විකාශනය සංක්ෂිප්තව, නිර්වචන, මූලධර්ම පදනම් වූ යහපාලනයන් සහ නීති රීති පදනම් වූ යහපාලනයන්, අධ්‍යක්‍ෂ මණ්ඩලය (පත්වීම්, වගකීම්, සුදුසුකම් සහ යෝග්‍යතාව පිළිබඳ උපමානයන්, ස්වාධීන අධ්‍යක්‍ෂවරුන් සහ විධායක අධ්‍යක්‍ෂවරුන් අතර තුලිතය, අධ්‍යක්‍ෂමණ්ඩල රැස්වීම්, දීමනා, නෛතික ප්‍රතිපාදන) සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී අතර අසම්බන්ධතාව/වෙන්ව පැවතීම, අධ්‍යක්‍ෂ මණ්ඩල අනු කමිටු (නම් කිරීම, පාරිතෝෂික, විගණන, කාර්යසාධන, අවදානම් කළමනාකරණ ආදිය), ප්‍රධාන කළමනාකරණ සේවක මණ්ඩලය, ව්‍යාපාරික ආකෘතිය, ව්‍යාපාර සහ මෙහෙයුම් ප්‍රතිපත්ති අධ්‍යක්‍ෂ මණ්ඩලය සහ ප්‍රධාන කළමනාකාරිත්වය විසින් ක්‍රියාත්මක කිරීම, ලෝකයේ මෑත කාලීනව වාර්තා වූ ආයතනික අපචාරයන්, ආයතනික සමාජයීය වගකීම් සහ පරිචයන්

(x) ආයතනික/ක්‍රමෝපාය සැලසුම්කරණය : දැක්ම, මෙහෙවර, වටිනාකම්, පරමාර්ථ සහ අරමුණු සැකසීම, පරිසර සුපරීක්‍ෂණය, ශක්‍යතා, දුර්වලතා,

අවස්ථා, අභියෝග/තර්ජන විශ්ලේෂණය, ව්‍යාපාරික ක්‍රමෝපායයන්, ප්‍රධාන කාර්යසාධන නිර්නායකයන් (KPI$_S$) සහ ඒවා මෙහෙයවීම් යාන්ත්‍රණය

(xi) මූල්‍ය වංචා : පොන්සි **(Poncy)** යෝජනා ක්‍රම (ගෝල්ඩන් කී, මැඩොෆ් **(Madoff)**, වංචනික ක්‍රියා සහ අභ්‍යන්තර පාලන ක්‍රමවල බිඳ වැටීම්, (බේරිං (Baring) සොසයිටිජෙනරල්, USB, JP මෝගන් චෙස්) ගිණුම්කරණ මැවීම් සහ දූර්වල යහපාලනයන්, (ශේෂ පත්‍රයෙන් බැහැරව වගකීම් සැඟවීම, එන්රොන්, ලීමන් බ්‍රදර්ස්) කාඩ් පත් වංචා, මුදල් විශුද්ධිකරණය සඳහා සහයවීම්, නිපැයුම් වැරදි ලෙස විකිණීම

(xii) අවදානම් කළමනාකරණය : විවිධ අවදානම් වර්ගීකරණයන් (ණය, ද්‍රවශීලතා, වෙළෙඳපොළ, මෙහෙයුම්, උපායමාර්ග, බාහිර ආදිය) අවදානම් ආයතන කෙරෙහි ඇති කරන බලපෑම, අවදානම් හඳුනාගැනීමේ නිර්නායකයන් සහ පද්ධතීන්, අවදානම් වාර්තාකරණ ක්‍රම, අවදානම් අවම කර ගැනීමේ ක්‍රියාවලීන් (අභ්‍යන්තර පාලනයන්, අවදානම් කමිටු, ස්වාධීන අවදානම් පාලක නිලධාරී රාමුව, අභ්‍යන්තර සහ බාහිර අධීක්ෂණයන්, අවදානම් පදනම් කර ගත් ප්‍රාග්ධනය වැනි සාර්ව මට්ටමේ අවදානම් ආවරණයන්) ක්‍රියාමාර්ග 3 කින් යුත් අවදානම් වලට එරෙහි වූ ආරක්ෂක ක්‍රමවේද, පළමු ක්‍රියාමාර්ගය ලෙස කළමනාකරණ පාලනයන්, දෙවන ක්‍රියාමාර්ගය ලෙස කළමනාකාරීත්වයේ පාලනයන්ගේ සහ අනුකූලතාවන්ගේ අතපසුවීම් සහ තෙවන ක්‍රියාමාර්ගය ලෙස ස්වාධීන ආරක්ෂනයන්

(xiii) ඇවර කිරීම : සමාගම් පනත අනුව ක්‍රියාපටිපාටීන් සහ වෙනත් අදාළ නෛතික විධිවිධාන

## 6. මූල්‍ය වෙළෙඳපොළ කටයුතු (වෛකල්පික)

### I. විෂය හැඳින්වීම සහ අරමුණු

මූල්‍යකරණය සහ තෝලනය තුළින් මූල්‍ය සම්පත් නිර්මාණය සහ හුවමාරුව මගින් වඩා යහපත් උපයෝජනයක් පිණිස ඉතුරුම් සහ අරමුදල් අලෙවිකරණය සඳහා මූල්‍ය වෙළෙඳපොල පහසුකම් සම්පාදනය කරනු ලබයි. බැංකු සහ වෙනත් ණය දෙන ආයතනයන් සම්බන්ධ අතරමැදිකරණ ව්‍යාපාරයන්ට අභියෝගාත්මකව සෘජුවම අරමුදල්/ඉතුරුම් ආයෝජකයන්ට සැපයීමට මූල්‍ය වෙළෙඳපොළ උපකාරී වේ. මූල්‍ය වෙළෙඳපොළෙ හි හුවමාරු වන මූල්‍ය උපකරණ ප්‍රධාන වර්ග දෙකකට අයත් වේ. එනම්, හුවමාරුව පිණිස අරමුදල් හෝ කොටස් හිමිකාරිත්වයන් සඳහා බෙදා හැරීම්, ණය සුරැකුම්පත් සහ ව්‍යවහාර මුදල්; අරමුදල්වලට හෝ කොටස් අරමුදල් මිලවලට හෝ/අනාගත බෙදාහැරීම් සඳහා සුරැකුම්පත් හෝ ලාභ හෝ අවදානම් කළමනාකරණය පිණිස ඇති ව්‍යුත්පන්නයන් ය. ලොව පුරා මූල්‍ය පද්ධතියේ ප්‍රධාන සංරචකය වන මූල්‍ය වෙළෙඳපොළ බැංකු, මූල්‍ය සහ මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය සඳහා විශාල ලෙස බලපෑම් කරයි. ආර්ථික ක්‍රියාකාරකම් සඳහා විශාල ලෙස අරමුදල් සම්පාදනය සහ පහසුකම් සම්පාදනය කරනුයේ මූල්‍ය වෙළෙඳ පොළ හරහා ය. එම නිසා ආර්ථික සංවර්ධනය සහ මූල්‍ය වෙළෙඳපොළ සංවර්ධනය එකිනෙක අත්වැල් බැඳ කටයුතු කරයි. මෙම පසුබිම යටතේ දියුණු වෙමින් පවතින රටවල් මූල්‍ය වෙළෙඳපොළ සංවර්ධනය පිණිස ඥානාන්විත ප්‍රතිපත්තීන් අනුගමනය කරනු ලැබේ. වත්මන් සන්දර්භය යටතේ බැංකු සහ මූල්‍ය අංශයේ වෘත්තීන්හිදී ඔවුන්ට සඵලදායී කාර්ය සාධනයක් සඳහා මූල්‍ය වෙළෙඳ පොළ කටයුතු සම්බන්ධව මනා අවබෝධයක් තිබිය යුතුය. තව ද කැප වී සිදු කරන ලද අධ්‍යයනයන් තුළින් වෘත්තිකයින්ට විශේෂිත වූ මූල්‍ය වෙළෙඳපොළ හෝ නිපැයුම් පිළිබඳව විශේෂ දැනුම ලබා ගැනීම සඳහා කටයුතු කළ හැකිය. එම නිසා, බැංකු සහ මූල්‍ය අංශයේ වෘත්තිකයන්ට සිය ඉහල කාර්ය සාධනයක් පිණිස ප්‍රධාන මූල්‍ය වෙළෙඳපොළ මෙහෙයුම් කටයුතු පිළිබඳව පුළුල් වූ දැනුමක් සම්පාදනය කිරීම සඳහා මෙම විෂයය සැලසුම් කොට ඇත.

## II . නිර්දේශිත විෂය අන්තර්ගතය

(i) ව්‍යාපාර වස්තු වෙළෙඳපොළ : සංවිධානය, ලැයිස්තු ගත කිරීමේ කාර්යපටිපාටිය, වෙළෙඳපොළ කාර්යසාධන දර්ශකයන්, වෙළෙඳාමේ ශිල්පීය ක්‍රම

(ii) බැඳුම්කර වෙළෙඳපොළ : රජයේ සුරැකුම්පත්, සංගමික බැඳුම්කර, වාණිජ පත්‍ර, සුකුක් (Sukuk) බැඳුම්කර

(iii) විදේශීය විනිමය වෙළෙඳපොළ : විනිමය අනුපාත තීරණය වීම, විනිමය අනුපාත ප්‍රතිපත්ති, එතැන්, ඉදිරි සහ හුවමාරු ගනුදෙනු, වෙළෙඳ ක්‍රමෝපායයන්, (පරස්පරය, මතු රැකුම්, සමපේක්ෂණයන්)

(iv) ව්‍යුහගත මූල්‍ය නිපැයුම් වෙළඳපොළ : සුරැකුම්කරණය සහ උපකරණ, ණය ව්‍යුත්පන්න, ඒවායේ අවදානම් සහ අවදානම් කළමණාකරන භූමිකාවන්

(v) මූල්‍ය ව්‍යුත්පන්න වෙළෙඳපොළ : ඉදිරි සුරැකුම්, හුවමාරු, විකල්ප, ඉදිරි ගනුදෙනු, ඒවායේ අවදානම් සහ අවදානම් කළමනාකරණ භූමිකාවන්

(vi) මූල්‍ය වෙළඳපොළ සේවා සම්පාදකයන් : හුවමාරු ස්ථාන, තැරැව්කරුවන්, අලෙවිකරුවන්, ශ්‍රේණිගත කිරීමේ නියෝජ්‍ය ආයතන, ණය කාර්යාංශ, තොරතුරු සම්පාදකයන් (රොයිටර්, බ්ලූම්බර්ග්), මූල්‍ය වෙළෙඳපොළ තොරතුරු පිළිබඳ ප්‍රකාශන (Financial Times, Wall Street Journal, Bloomberg TV)

(vii) මෑත කාලීන මූල්‍ය වෙළඳපොළ අර්බුද පිළිබඳ සාහිත්‍ය : හේතු, ස්වභාවය සහ ආසියානු මූල්‍ය අර්බුදය වැනි ප්‍රාදේශීය මූල්‍ය අර්බුද හා මෑත කාලීන ගෝලීය මූල්‍ය අර්බුදවල බලපෑම, මූල්‍ය වෙළඳ පොළ අර්බුද වලක්වා

ගැනීම සහ විසඳීම සම්බන්ධව නියාමකයින්ගේ භූමිකාවන්, වත්මන් ගෝලීය විධිමත්කරණ ප්‍රතිසංවිධාන ක්‍රියා කටයුතු සහ වාර්තා

## 7. ආයෝජන බැංකු කටයුතු (වෛකල්පික)

### I. විෂය හැඳින්වීම සහ අරමුණු

ආයෝජන බැංකු කටයුතු, මූල්‍ය වෙළඳපොලට සහ ආයෝජකයන්ට, ප්‍රධාන වශයෙන් මූල්‍ය සේවාවන් සඳහා පහසුකම් සලසමින් බොහෝ දුරට බැංකු ආශ්‍රිතව ක්‍රමයෙන් විකාශනය වන මූල්‍ය සේවාවන් ය. ආයෝජන බැංකු, බැංකු සමූහයක් තුළ හෝ වෙනත් ව්‍යාපාර/මූල්‍ය කණ්ඩායම් තුළ ක්‍රියාත්මක වේ. මූල්‍ය වෙළෙඳ පොළ විශාල වශයෙන් දියුණු වීමට ආයෝජන බැංකු ඉවහල් විය. විශාල වශයෙන් ආයෝජන බැංකු ක්‍රියාත්මක වන මූල්‍ය වෙළඳ පොළවල් දියුණු වී ඇත. මෙම ආයෝජන බැංකු ආයතනික සහ පුද්ගල ආයෝජකයන් යන දෙපාර්ශවයටම සිය ආයෝජනයන් පිළිබඳව කටයුතු කිරීම සඳහා ආයතනික මූල්‍යකරණය, ව්‍යාපාර ප්‍රතිව්‍යුහකරණය සහ මූල්‍ය කළමනාකරණ උපදේශක සේවාවන් සපයනු ලබයි. තවද ආයෝජන බැංකු ලොව පුරා වෙළඳ පොළවල විවිධ මාදිලියේ නව්‍ය සහ සංකීර්ණ මූල්‍ය නිපැයුම් ඉදිරිපත් කරමින් මූල්‍ය සේවා නිර්මාණ වෘත්තියේ ප්‍රවර්තකයන් ලෙස කටයුතු කරනු ලබයි. ආර්ථික වර්ධනය පිණිස පහසුකම් සම්පාදනය සඳහා නැගී එන වෙළෙඳ පොළවලට ද සිය මූල්‍ය වෙළඳපොළ සංවර්ධනය කර ගැනීම සඳහා ආයෝජන බැංකු අවශ්‍යව ඇත. කෙසේ වුවත්, මූල්‍ය වෙළඳපොළ අර්බුද සඳහා ආයෝජන බැංකු වල සංකීර්ණ ස්වරූපයේ මූල්‍ය නිපැයුම්වල බලපෑම දෝෂ දර්ශනයට ලක්ව ඇති අතර ආයෝජන බැංකු නව ශික්ෂණයන් යටතේ සිල්ලර බැංකුවලින් වෙන්කර කටයුතු කිරීම දැන් හඳුන්වා දෙමින් පවතී. එම නිසා, ආයෝජන බැංකු කටයුතුවල ප්‍රධාන ප්‍රමිතීන් පිළිබඳව සහ බැංකු සහ මූල්‍ය වෘත්තිකයන්ට විශේෂිත වූ ආයෝජන බැංකු ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා එහි නව ප්‍රවණතා පිළිබඳව අවබෝධයක් සැලසීම පිණිස මෙම විෂය සැලසුම් කොට ඇත.

## II . නිර්දේශිත විෂය අන්තර්ගතය

(i) ආයෝජන බැංකු ව්‍යාපාරයේ විකාශනය

(ii) නිකුතු කළමනාකරණය : සාධිකාරිත්ව සහ ණය සුරැකුම් පත්‍ර

(iii) සුරැකුම්පත් ව්‍යුහකරණය

(iv) වත්කම් සුරැකුම්කරණය

(v) සුරැකුම් පත් නිකුතු ප්‍රාරක්ෂණය

(vi) ආයතනික මූල්‍ය සේවාවන් : ණය සංයුක්තකරණය සහ ලීවරණිත මිලට ගැනීම් සකස් කිරීම

(vii) ආයෝජන උපදේශන සේවා

(viii) මූල්‍ය තැරැව්කරණය

(ix) හිමිකාරිත්ව වෙළෙඳාම

(x) ඒකාබද්ධවීම් සහ අත්පත්කර ගැනීමේ සේවා : යෝග්‍යතා විචක්ෂණ, අධ්‍යයනයන්, උපදේශක සේවා, සකස් කිරීම් සහ මූල්‍යකරණය

(xi) වත්කම් කළමනාකරණය

(xii) අරමුදල් කළමනාකරණය

(xiii) ගැටලුවලට මුහුණ දුන් සමාගම් වලට ප්‍රතිව්‍යුහකරණය සහ ප්‍රති ප්‍රාග්ධනකරණය

(xiv) ආයෝජන පර්යේෂණ සහ සුරැකුම්පත් විශ්ලේෂණය

(xv) ව්‍යාපෘති ඇගයීම

## 8. සංවර්ධන මූල්‍ය (වෛකල්පික)

## I. විෂය හැඳින්වීම සහ අරමුණු

සම්ප්‍රදායික ණය දීමේ දී පදනම් වූ සුරැකුම් සහ ණයකරු ණය දෙන ආයතනය සමඟ පවත්නා අතීත ව්‍යාපාරික සබඳතා පදනම් කරගෙන ණය දීමේ ක්‍රමයට වෙනස්ව ව්‍යාපෘතියේ අනාගත ආදායම් ප්‍රවාහයන් සහ ශක්‍යතාව පදනම් කරගෙන විශේෂයෙන් ම ආදායම් උත්පාදන ව්‍යාපෘතීන් මූල්‍යකරණය සඳහා නිර්මාණය කරන ලද ණය නිපැයුම් සංවර්ධන මූල්‍ය යටතට අයත් වේ. මීට අමතරව, මූල්‍ය

නොවන උපකාරක සේවා එනම් පුහුණු වීම්, කළමනාකරණය සහ මූල්‍ය උපදෙස්, පසු විපරම් සහ ව්‍යාපාර ප්‍රතිව්‍යුහකරණයන් ආදිය සම්පාදනය හෝ පිළියෙළ කර දීම ණය දෙන ආයතනය විසින් කරනු ලබයි. එම නිසා, ව්‍යාපාරික ව්‍යවසායකත්වයන්ට ණය හා බැඳුන උපකාරක සේවා රාශියක් ණය දෙන ආයතනය විසින් සම්පාදනය කිරීම සංවර්ධන මූල්‍යකරණයට අයත් වේ. ව්‍යාපාරික ඒකකයන් ක්ෂුද්‍ර ව්‍යාපාරවල සිට සුළු සහ මධ්‍යම පරිමාණ ව්‍යාපාර තෙක් පැතිර පවතී. සංවර්ධන මූල්‍යකරණය සංවර්ධනය වන ආර්ථිකයන්ට සෘජුවම නිෂ්පාදනය, ආදායම සහ රැකියා උත්පාදනයට සහ බැංකු සහ මූල්‍යායතන වලට සිය සිල්ලර ගනුදෙණුකාර පදනම පුළුල් කර ගැනීමට විශේෂයෙන් වැදගත් වේ. එම නිසා, රාජ්‍ය ආර්ථික හා නියාමන ප්‍රතිපත්තීන් හරහා විශේෂිත ණය සම්පාදිත ආයතන සහ බෙදාහැරීම් පද්ධතීන්ට උපකාරී වේ. බැංකු සහ මූල්‍ය වෘත්තිකයන්ට ආර්ථිකයේ කැපවූ ව්‍යාපාරික අංශයක් ලෙස සංවර්ධන මූල්‍ය බැංකු කටයුතුවල ඵලදායී ලෙස නියැලීම පිණිස සංවර්ධන මූල්‍ය නිපැයුම් සහ බෙදාහැරීමේ ආකෘති පිළිබඳව දැනුම සම්පාදනය සඳහා මෙම විෂය සැලසුම් කොට ඇත.

## II . නිර්දේශිත විෂය අන්තර්ගතය

(i) ව්‍යාපෘති ණය ප්‍රදානය : ව්‍යාපෘති මූල්‍යකරණයේ තාර්කිකත්වය, සුරැකුම් පදනම් වූ සහ ව්‍යාපෘති පදනම් වූ මූල්‍යකරණය

(ii) වාණිජ ණය තීරණයන්ට එරෙහිව ණය තීරණය සඳහා ව්‍යාපෘති ඇගයීම : වෙළඳපොළ සහ ඉල්ලුම් විශ්ලේෂණය (අවස්ථා විශ්ලේෂණය, ඉල්ලුම් පුරෝකතනයන්) තාක්ෂණික විශ්ලේෂණය (නිෂ්පාදන ක්‍රියාවලිය සහ තාක්ෂණය - නිපැයුම් මිශ්‍රණ, යන්ත්‍ර ධාරිතාව, පිහිටීම සහ වැඩබිම, ව්‍යාපෘති සටහන්) මූල්‍ය විශ්ලේෂණය (ව්‍යාපෘති පිරිවැය ඇස්තමේන්තු සහ මූල්‍යකරණ මූලාශ්‍ර නිමැවුම් සහ විකුණුම් ඇස්තමේන්තු, නිෂ්පාදන පිරිවැය, කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සහ ඒවා මූල්‍යකරණයන්, සමච්ඡේදන ලක්ෂ්‍ය, පුරෝකථනිත මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, පුරෝකථනිත ශේෂ පත්‍රය) ශක්‍යතා උපමානයන්, වට්ටම් කළ මුදල් ප්‍රවාහ (DCF) සහ DCF නොවන

ක්‍රම, අභ්‍යන්තර ඵලදා අනුපාතය (IRR) පිළිගෙවුම් කාල, සංවේදිතා විශ්ලේෂණය, මූල්‍ය ව්‍යුහකරණය, ව්‍යාපෘති ශක්‍යතා වාර්තා සැකසීම

(iii) සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යවසායයන් මූල්‍යකරණය : සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපෘති නිර්වචනය, ආර්ථික සංවර්ධනයෙහිලා ඒවායෙහි භූමිකාව, බැංකු සහ මූල්‍යායතනවලට සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපෘති මූල්‍යකරණයේ වැදගත්කම, මූල්‍යකරණ මූලාශ්‍ර (ප්‍රතිමූල්‍ය, ගෝලීය අරමුදල්, පොලී සහනාධාර, ණය ඇප ආවරණ ව්‍යවසායකත්ව ප්‍රාග්ධනායතන) සහන ප්‍රතිපත්තීන් (නියාමන/බදු සහන, ව්‍යාප්ති සේවා ආදිය) අසාර්ථක ව්‍යාපෘතීන් පුනරුත්ථාපනය.

(iv) ක්ෂුද්‍ර මූල්‍ය : දුප්පත්කම අවම කිරීම සඳහා ක්ෂුද්‍ර මූල්‍යකරණයේ වැදගත්කම, දුගී බවේ රේඛාව, ක්ෂුද්‍ර මූල්‍ය බෙදාහැරීමේ ආකෘති, මූල්‍ය සාක්ෂරතාව සහ අන්තර්ගත කිරීම, බංග්ලාදේශ් ග්‍රාමීන් බැංකුව, සදාචාරාත්මක නොවන ක්ෂුද්‍ර මූල්‍යකරණයන් සහ පරිචයන්, ක්ෂුද්‍ර මූල්‍ය නියාමනය කිරීම සහ අභියෝග

## 9. මහ බැංකු කටයුතු (වෛකල්පික)

### I. විෂය හැඳින්වීම සහ අරමුණු

මූලික වාණිජ බැංකු කටයුතුවල සිට මූල්‍ය සහ මුදල් ප්‍රතිපත්ති සම්පාදකයකු සහ නියාමකයකු ලෙස මහ බැංකුවක් විසින් කරන කටයුතු ලොව තුළ විකාශනයට ලක් වී ඇත. එක් එක් රටෙහි විශේෂිත ආර්ථික සහ මූල්‍ය අවශ්‍යතා අනුව ඒවායේ පාලන පද්ධතීන් සහ මෙහෙයුම් ආකෘතීන් එකිනෙකට වෙනස් වේ. පොදුවේ ගත් කල, මහ බැංකු විසින් මුදල් නෝට්ටු මුද්‍රණය, සාර්ව ආර්ථික අරමුණු සඳහා මුදල් සංසරණ ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීම (මුදල් ප්‍රතිපත්තිය), ආරක්ෂාකාරී සහ යහපත් බැංකු පද්ධතියක් සඳහා බැංකු නියාමනය කිරීම, ජාත්‍යන්තර විශ්වාසය තහවුරු කර ගැනීම සඳහා රටේ ජාත්‍යන්තර සංචිත කළමනාකරණය සහ රජයට විෂය මූලික ලෙස ආර්ථික සහ මූල්‍ය ප්‍රතිපත්ති සම්බන්ධ උපදෙස් ලබා දීම කරනු ලබයි. දේශීය සහ ජාත්‍යන්තර වශයෙන් ගත් කල බැංකු සහ මූල්‍ය අංශවල ව්‍යාපාර

කටයුතු මෙන්ම ස්ථාවරත්වයද මහ බැංකු ප්‍රතිපත්තිවල බලපෑම් මත විශාල ලෙස රඳා පවතියි. මහ බැංකු ප්‍රතිපත්තීන් පිළිබඳව පුරෝකතනය කිරීමට හෝ අවබෝධ කර ගැනීමට ව්‍යාපාරික කළමනාකරුවන්ට නොහැකි වූ විට ව්‍යාපාර කටයුතු අනපේක්ෂිත අන්දමේ ප්‍රතිඵලවලට මුහුණ දෙනු ඇත. මේ අතර, මහ බැංකු ප්‍රතිපත්තීන් ආර්ථික ක්‍රමයේත් බැංකු සහ මූල්‍ය අංශයන්ගේත් ප්‍රවර්ධනයට සහ ස්ථාවරත්වයට උපකාරී වේ. එම නිසා, බැංකු සහ මූල්‍ය අංශයේ වෘත්තිකයින්ට මහ බැංකු පරිසරය තුළ සාර්ථක ලෙස කටයුතු කිරීමට හැකි වන අයුරින් මහ බැංකු කටයුතු සම්බන්ධයෙන් න්‍යායාත්මක සහ ප්‍රායෝගික යන දෙඅංශයේ ම දැනුම සම්පාදනය සඳහා මෙම විෂයය සැලසුම්කොට ඇත.

## II . නිර්දේශිත විෂය අන්තර්ගතය

(i) ලොව තුළ මහ බැංකුකරණයේ විකාශනය සහ පාදක වූ සිද්ධීන්

(ii) මහ බැංකු කාර්යයන්ගේ විකාශනය : ව්‍යවහාර මුදල් නිකුතුව, මූල්‍ය ප්‍රතිපත්ති, බැංකුකරුවන්ගේ බැංකුව, අවසාන ණය දෙන්නා, විදේශීය සංචිත කළමනාකරණය, බැංකු/මූල්‍ය නියාමනයන්

(iii) මහ බැංකු පරමාර්ථ : කේවල, ද්විත්ව සහ බහුවිධ

(iv) ශ්‍රී ලංකා මහ බැංකුවේ මෙහෙයුම් : ව්‍යවහාර මුදල් මණ්ඩල ක්‍රමය, මහ බැංකුව ස්ථාපනය, එහි අරමුණු සහ ප්‍රධාන කාර්යයන්, මුදල් මණ්ඩලය, මහ බැංකුවේ සංවිධාන ව්‍යුහය, මුදල් නීති පනතේ ප්‍රධාන ප්‍රතිපාදනයන්, මූල්‍ය ප්‍රකාශන, ක්‍රමෝපාය සැලසුම්, අතීත ප්‍රතිපත්ති

(v) ප්‍රධාන පෙළේ ගෝලීය මහ බැංකු පිළිබඳ සමීක්ෂණය සහ මෑත කාලීන ප්‍රතිපත්තීන් : එංගලන්ත මහ බැංකුව (Bank of England), එක්සත් ජනපද සන්ධීය සංචිත ක්‍රමය (US Federal Reserve System), යුරෝපීය මහ බැංකුව (European Central Bank), ජපාන මහ බැංකුව යනාදි වශයෙන් මුදල් ප්‍රතිපත්ති උපකරණයන්ගේ විකාශනය (සම්ප්‍රදායික සහ සම්ප්‍රදායික

නොවන) ප්‍රමාණාත්මක පහසුකරණයන්, බිඳ වැටෙන බැංකු සහ මූල්‍යායතන සඳහා පහසුකම් සැලසීම.

(vi) මහ බැංකු වල ස්වාධීනත්වය : සංකල්පය, නෛතික ප්‍රතිපාදන, ගෝලීය පරිචයන් ප්‍රධාන ප්‍රතිපත්තිමය අභියෝග

## අධ්‍යයනය කල යුතු දෑ

අපේක්ෂිත අයදුම්කරුවන්ට මගපෙන්වීම සඳහා නිර්දේශිත පොත් ඇතුළත් අධ්‍යයන ලැයිස්තු සහ පිළිතුරු සහිත ආදර්ශ ප්‍රශ්න පත්‍ර ලබාදෙනු ඇත. සාධාරණ කාල සීමාවක් තුළ සියලුම විෂයයන් සඳහා අධ්‍යයන කට්ටල ලබා දීමේ වැඩපිළිවෙළක් ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය විසින් ක්‍රියාත්මක කරනු ලැබේ. මෙම පාඨමාලාවේ ඇතුළත් විෂයයන් පිළිබඳ බොහෝ පොත්පත් හා අධ්‍යයන මූලාශ්‍ර ඉංග්‍රීසි භාෂාවෙන් පවතින බව සඳහන් කරමු. නිර්දේශිත පාඨ ග්‍රන්ථ, සඟරා ලිපි සහ ව්‍යාපාරික ප්‍රවෘත්ති විභාග සඳහා සූදානම් වීම පිණිස අධ්‍යයනය කරන ලෙස අපේක්ෂක අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ. නව අධ්‍යයන වැඩසටහනට අදාල අධ්‍යයන කට්ටල / අධ්‍යයන මාර්ගෝපදේශයන් සහ ඉගැන්වීම්/ඉගෙන ගැනීමේ ක්‍රමවේදයන් සහ කුසලතා නිසි ලෙස සකස් වීමට යම් කාලයක් ගතවනු ඇතැයි අපේක්ෂා කරයි.

## වැඩි විස්තර සඳහා විමසීම්

**ලියාපදිංචිය සහ විභාග සඳහා**

අධ්‍යක්ෂ, විභාග
අංක. 80A, ඇල්විටිගල මාවත
කොළඹ 08
දුරකතන : 5220330, 5220312
ඊමේල් : exam@ibsl.lk

**දේශන සදහා**

අධ්‍යක්ෂ, බැංකු හා මූල්‍ය විද්‍යාලය
අංක. 80A, ඇල්විටිගල මාවත
කොළඹ 08
දුරකතන : 5741616, 2684382
ඊමේල් : cobaf@ibsl.lk

**සාමාජික සබඳතා**

අධ්‍යක්ෂ, සාමාජික සබඳතා
අංක. 80A, ඇල්විටිගල මාවත
කොළඹ 08
දුරකතන :5220330,5220307
ඊමේල් : mr@ibsl.lk

වෙබ් අඩවිය : www.ibsl.lk